## II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### ප්‍රශ්න පත්‍රවල ස්වභාවය

අ. පො. ස. (සා. පෙළ) විභාගයෙහි (21) සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයයෙහි ශිෂ්‍ය සාධනය ඇගයීම සඳහා ප්‍රශ්න පත්‍ර තුනක් ඉදිරිපත් කෙරේ. ඒවා අතුරෙන් I පත්‍රය සහ II පත්‍රය යන ප්‍රශ්න පත්‍ර දෙක ම අපේක්ෂකයින්ට එකවර ලබා දෙන අතර එම පත්‍ර දෙක සඳහා නියමිත කාලය **පැය තුනකි**. සිංහල සාහිත්‍යය කුසලතා මැනීම III පත්‍රයෙන් අපේක්ෂිත ය. ඒ සඳහා නියමිත කාලය **පැය දෙකකි**.

**අවසාන ලකුණු ගණනය කිරීම**

| | | | |
|---|---|---|---|
| I පත්‍රය සඳහා | - | ලකුණු | 40 |
| II පත්‍රය සඳහා | - | ලකුණු | 80 |
| III පත්‍රය සඳහා | - | ලකුණු | 80 |
| එකතුව | - | ලකුණු | 200 |
| අවසාන ලකුණ | - | 200 ÷ 2 = 100 | |

## 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

I පත්‍රය - **කාලය පැය 01යි.**
බහුවරණ ප්‍රශ්න 40කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

II පත්‍රය - **කාලය පැය 02යි.** ප්‍රශ්න 05කි. (මුළු ලකුණු 80කි.)
ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

- 1 ප්‍රශ්නය : කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20කි.
- 2 ප්‍රශ්නය : රචනා ලිවීම. ලකුණු 25කි. (ව්‍යුහගත තේමා 4ක් අතුරෙන් එකක් තෝරා ගත යුතු ය.)
- 3 ප්‍රශ්නය : සාරාංශකරණය : ලකුණු 10කි.
- 4 ප්‍රශ්නය : අවබෝධය : ලකුණු 10කි.
- 5 ප්‍රශ්නය : ප්‍රායෝගික ලේඛනය : ලකුණු 15කි. (වෛකල්පික ප්‍රශ්න කොටස් දෙකකින් එකකට පමණක් පිළිතුරු ලිවිය යුතු ය.)

2.1.2 **I** ප්‍රශ්න පත්‍රය

- අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** අයියා **ඇඟිලි ගනිමින් සිටින්නේ** රැකියාවක් ලැබෙන තුරු ය.
(1) නිකම් බලා සිටින්නේ (2) මහත් බලාපොරොත්තුවෙන් සිටින්නේ
(3) දින සති ගෙවමින් සිටින්නේ (4) නිවසට වී කල් යවන්නේ

**2.** වරදක් සිදු කර **කොළේ වහන එක** යහපත් දෙයක් නොවේ.
(1) සඟවාගෙන සිටීම (2) ආපසු හැරී සිටීම
(3) බොරු ප්‍රචාරය කිරීම (4) නොපිළිගෙන සිටීම

**3.** නංගී **තකහනියෙන්** ම ආවේ අම්මාට යමක් කීමට ය.
(1) බියේ ගැහෙමින් (2) සිනාසෙමින්
(3) කෑගසමින් (4) ඉක්මනින්

- අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** භාෂාවේ පරිණාමය පිළිබඳ කතාව රසවත් ............................ කි.
(1) පර්යේෂණය (2) විමර්ශනය (3) වෘත්තාන්තය (4) සම්මර්ශනය

**5.** 'ශ්‍රී ලංකාවේ ගොන්ඩ්වානා තැන්පතු' නම් ලිපිය ජුරාසික පොසිල පිළිබඳ ලියැවී ඇති ශාස්ත්‍රීය .................... කි.
(1) වාර්තාව (2) මූලාශ්‍රය (3) ප්‍රකාශය (4) ජනප්‍රවාදය

**6.** ලේඛකයාගේ .................... වී ඇත්තේ සමාජය යහමගට ගැනීමට උපකාර වන පණිවුඩයක් තම කෘතිය මගින් පාඨකයාට ලබාදීමයි.
(1) අභිමානය (2) ප්‍රාර්ථනය (3) සම්ප්‍රදාය (4) අභිප්‍රාය

**7.** අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පෙළිය තෝරන්න.
(1) රත්තරන්, රදාවාන, රාස්සගල, රබාන (2) ඉතාලිය, ඉතියෝපියාව, ඕලන්දය, චීනය
(3) සමාජය, සාහිත්‍යය, හාස්‍යය, චමත්කාරය (4) විදග්ධ, විශේෂ, විශාල, සෞම්නස

**8.** සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පෙළිය තෝරන්න.
(1) ප්‍රකාශන විලාසය, අතීතාවර්ජණය, ප්‍රතිබිම්භය, පෘෂ්ඨීමත්
(2) සුභාසිංසනය, කාව්‍යශේඛරය, අභ්‍යවකාශය, කළමනාකරණය
(3) ධාරාණිපාත, උපාධි ප්‍රදානය, සැලසුම, සාමර්ථ්‍යය
(4) ප්‍රවර්ධනය, ව්‍යවස්තාව, උත්කෘෂ්ටාලංකාර, පාරිභෝගිකයා

**9.** **යංශය, රකාරාංශය, රේඵය** සහ **ගැට ඇලපිල්ල** අනුපිළිවෙළින් යෙදී ඇති උත්තරය තෝරන්න.
(1) ත්‍යාග, ප්‍රසාද, තර්ක, කෘශ (2) කෘශ, ප්‍රසාද, තර්ක, ත්‍යාග
(3) තර්ක, කෘශ, ත්‍යාග, ප්‍රසාද (4) ප්‍රසාද, තර්ක, කෘශ, ත්‍යාග

**10.** 'තාරපති' යන වචනය අයත් වන්නේ,
(1) විශේෂණ සමාසයට ය. (2) ද්කාරාර්ථ සමාසයට ය.
(3) අන්‍යාර්ථ සමාසයට ය. (4) විභක්ති සමාසයට ය.

**11.** ඇය දෙවඟනක මෙන් රූමත් ය. යන වාක්‍යයේ 'මෙන්' යනු,
(1) නාම පදයකි. (2) විශේෂණ පදයකි.
(3) උපසර්ගයකි. (4) නිපාත පදයකි.

**12.** 'අසමින්' යන ක්‍රියා පදයේ 'අස' යනු,
(1) ධාතු ප්‍රකෘතියකි. (2) ප්‍රත්‍යයකි. (3) නිපාතයකි. (4) විශේෂණයකි.

**13.** මගීහු **දුම්රිය මාර්ගයෙන්** ඉවත් වූහ. යන වාක්‍යයේ 'දුම්රිය මාර්ගයෙන්' යන්න,
(1) සම්ප්‍රදාන විභක්තියට අයත් වේ. (2) කර්තෘ විභක්තියට අයත් වේ.
(3) අවධි විභක්තියට අයත් වේ. (4) ප්‍රථමා විභක්තියට අයත් වේ.

- අංක **14** සිට **16** තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

**14.** සන්නිවේදන **ශක්‍යතාව**, භාෂාව නිසා මිනිසාට ලැබුණු උරුමයකි.
(1) හැකියාව (2) මාර්ගය (3) පුරුද්ද (4) ප්‍රබලතාව

**15.** එම නිර්මාණයේ **මුඛ්‍යාර්ථය** වූයේ ජනතාව තුළ දේශානුරාගය ඇති කිරීමයි.
(1) මූලික ආදර්ශය (2) මූලාරම්භය
(3) ප්‍රමුඛ තත්ත්වය (4) මූලික අදහස

**16.** සුළි සුළඟින් **අවිනෂ්ට** වූ දේවල් දැක අපි පුදුම වූයෙමු.
(1) විනාශයට පත් වූ (2) විනාශයට පත් නොවූ
(3) ප්‍රතිසංස්කරණය කළ (4) විකෘත වූ

**17.** පහත සඳහන් පද අයත් වන ව්‍යාකරණ ප්‍රවර්ගය තෝරන්න.
කැහැටු, කළටි, පහටි
(1) තද්ධිත (2) කෘදන්ත
(3) නිපාත (4) රූඪී

**18.** පද කිහිපයක් කැටි කොට ගැනීමෙන් තනි පදයක් බවට සකස් වීම,
(1) තද්ධිත නාමයි. (2) සමාස නාමයි. (3) කෘදන්ත නාමයි. (4) සර්ව නාමයි.

**19.** එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල සමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නො වන** පද පේළිය තෝරන්න.
(1) අංජන - අඳුන්, අත්සුණු - අග්ගළා, අග්‍ර - පරම, ගද්‍ය - ගැදි
(2) ආනන්දය - ප්‍රමෝදය, එකලා - තනි, දැමිටු - ධර්මිෂ්ඨ, මන්දස්මිතය - මඳ සිනහව
(3) රජ - නරේන්ද්‍ර, කඩුව - කග, රවි - දිවාකර, වියළි - ශුෂ්ක
(4) සකසුරුවම - අරපරෙස්සම, ඉඳුදුනු - දේදුන්න, පාසඟල - සරණයුග, විකසිත - මුකුලිත

**20.** විරුද්ධාර්ථවත් පද යුගලයක් **නො වන්නේ** මෙයින් කුමක් ද?
(1) අලංකාර - භූෂණ (2) කුටිල - වංක
(3) අභිවෘද්ධිය - පරිහානිය (4) බුහුමන - අවමන

**21.** 'භාෂාවේ උපත සම්බන්ධයෙන් මත කිහිපයක් පළ වී තිබේ.' යන වාක්‍යයේ 'උපත' යන්න වෙනුවට යෙදිය හැකි වඩාත් යෝග්‍ය පදය කුමක් ද?
(1) ප්‍රතිලාභය (2) සම්භවය
(3) පුනරුප්පත්තිය (4) පරිණාමය

**22.** වෙළෙන්දා පොළට ගොස් බඩු ගනිද්දී මිතුරෙක් පිටට තට්ටු කළේ ය.
ඉහත සඳහන් වාක්‍යයේ ඇති ක්‍රියාපද පිළිවෙළින් දැක්වෙන උත්තරය තෝරන්න.
(1) අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා
(2) පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
(3) පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
(4) ප්‍රයෝජ්‍ය ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා

**23.** **වැරදි** අදහස දෙන වාක්‍යය තෝරන්න.
(1) කුකවි යනු අව්‍යය සමාසය සඳහා නිදසුනකි.
(2) බුජ බල යන්නෙහි අර්ථය බාහු ශක්තිය යන්නයි.
(3) 'කියග මගිය එනු කොහි සිට' යන වාක්‍යයේ කියග යනු පූර්ව ක්‍රියාවකි.
(4) අනුජාත යන වචනයේ අනු යනු උපසර්ගයකි.

**24.** ස්වරාදේශ සන්ධියට උදාහරණයක් **නො වන්නේ** කුමක් ද?
(1) දැත (2) අරුණෝදය (3) මහේශ්වර (4) පලාපල

**25.** දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි ග්‍රන්ථ නාමය තෝරන්න.
(1) ග ය ම් හෙ ළි ර (2) යෝ ක ම රු ක් ගා ර (3) න ව බා ඩ න න් (4) හෙ මා යි ය රු ම් ව

- අංක **26, 27** යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

**26.** කිසිම ආකාරයකින් නිදහසක් නොමැති වීම
(1) ඉස රුදාවට කොට්ටෙ මාරු කළා වගේ (2) ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්නා වගේ
(3) ගිරයට අහු වුණු පුවක් ගෙඩිය වගේ (4) කම්මලේ ඉන්න බල්ලා වගේ

**27.** තමන් කළ වැරැද්ද තමන්ට ම දැනීම
(1) අඛ කෑ මිනිහාගේ නහය දනවා වගේ (2) අනුන්ට කැපූ වළේ තමන් වැටුණා වගේ
(3) හිල් කුඩෙන් වතුර අදිනවා වගේ (4) අටුවෙන් දූමට පැන්නා වගේ

**28.** A - ජයතිස්ස සහ රොසලින් - මාර්ටින් වික්‍රමසිංහ
B - නොලසා - ශීඝ්‍රාර්ථයේ නිපාත
C - පරිණාමවාදය - යමක ක්‍රමික විකාශනය
D - අටු කොටු - යුගල පද

A, B, C, D ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A, C හා D ය. (4) B, C හා D ය.

- අංක **29, 30** යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

**29.** (1) මා විභාගයෙන් සමත් වෙති'යි සියලු දෙනා සිතයි.
(2) ශිෂ්‍යයන් කෝලාහලයට සම්බන්ධ නැත.
(3) මිනිස්සු විසින් ගස්වැල් ආරක්ෂා කරනු ලබයි.
(4) නාය යෑමෙන් සතුන් ද මිනිසුන් ද කරදරයට පත් විය.

**30.** (1) සියලු නළුනිළියෝ වේදිකාවේ රඟපානු ඇත.
(2) ළමයි ප්‍රවීණයන් මෙන් රංගනයේ යෙදුණහ.
(3) ඔවුන් දක්ෂ ක්‍රීඩකයෝ ද?
(4) අපි රෝගීන්ට උවටැන් කරනු වටී.

**31.** **පරිත්‍යාගශීලීහු** තම ආධාර විපතට පත්වූවන්ට බෙදා දුන්හ.
මතින් තොරවී නීරෝගීව **ජීවත් වන්න.**
ඔහු **නරියකු** මෙන් කපටි ය.
ප්‍රධානියා ලේකම්වරිය ලවා ලිපියක් **ලියවයි.**
ඉහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද හැඳින්වීම සඳහා යෙදෙන ව්‍යාකරණමය අනුඅංගවල අනුපිළිවෙළ කුමක් ද?

A - උක්ත කර්තෘ
B - අනුක්ත කර්මය
C - ප්‍රයෝජ්‍ය ක්‍රියා
D - විධි ක්‍රියා

(1) A, B, D, C (2) A, C, D, B (3) A, D, B, C (4) B, A, C, D

**32.** පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"අපි ගායකයන් එක්ක කතාබහ කළා."
(1) අපි ගායකයන් සමග කතාබහ කළෙමු.
(2) අප ගායකයන් සමග කතාබහ කළෙමු.
(3) ගායකයෝ සමග අපි කතාබහ කළෝ ය.
(4) ගායකයෝ සමග අපි කතාබහ කළෙමු.

**33.** ඇරැව්වල නන්දිමිත්‍ර මහතාගේ නිර්මාණයක් වන්නේ,
(1) සෙංකොට්ටං (2) වතුර මල
(3) වක්කඩ බඳිමු (4) පියසේන ඇසූ ප්‍රශ්නයක්

**34.** රූපකයක් සහිත පාඨය තෝරන්න.

(1) මේ නේත්‍රද්වය නිසා ඈ සුනේත්‍රා නම් වන්නී ය. ඒ වර්ණයෙන් හා දීප්තියෙන් ඉඳුනිල්මිණි රුවනක් බඳු ය.
(2) සවනක් ගන බුදුරැසින් මුළු ලොව සදමින් වඩුත් වඩුත් සියලු නුවර රැසින් සැදෙත් සැදෙත් ගෙයි ගෙයි පිල්සක් විදහා මොනරු නටත් නටත්
(3) නානාවිධ විහඟ ගණයාගේ මධුර ඣංකාර කූහකූහාරව ගුමුගුමාරවාදීන් කන්කලු වූ සුපුෂ්පිත වැකොඳ තමාලලතාදි
(4) හේ මල්පෙති යුවළක්ව දෙතොලින් ආවරණය වුව ද සිනාසෙන කල පුෂ්පගර්භයක් මෙන් විකසිත වන බැවින් සිනහවට ම සැදුණු මුව පියුමෙකැයි කිව යුතු

**35.** තලමල පිපිලා, ගුරුතරුව, සඳගිර යන නාට්‍යවල නිර්මාණකරුවා වන්නේ,

(1) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ය.
(2) ගුණසේන ගලප්පත්ති ය.
(3) ජයලත් මනෝරත්න ය.
(4) හෙන්රි ජයසේන ය.

**36.** පහත සඳහන් කවියේ හතරවැනි පදය තෝරන්න.

"වලාකුළේ රන් පාටට විදුලි කොටනවා
ආකාසේ හඬ තළමින් අකුණු හඬනවා
බිංදු බිංදු මහ පොළොවට වතුර වැටෙනවා
........................................................."

(1) ගල් ගහන්නා වගේ වතුර කැට වැටෙනවා
(2) කළු වලා කැලඹෙමින් මුදුන් වී නැඟෙනවා
(3) හෝ ගාමින් අපේ ගමට වැස්සක් එනවා
(4) වහිනවා වහිනවා වහිනවා වහිනවා

**37.** "රත්න දීප ජන්මභූමි
ලංකාදීප විජයභූමි
මේ අපේ උදාර වූ මාතෘ භූමියයි"

ඉහත සඳහන් වන්නේ ලංකාවේ ප්‍රසිද්ධ ගීතයක කොටසකි. එම ගීතයේ පදරචකයා වන්නේ,

(1) මහගමසේකර ය.
(2) රත්න ශ්‍රී විජේසිංහ ය.
(3) ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි ය.
(4) ඩබ්. ඒ. අබේසිංහ ය.

**38.** ධීවර ජනවහරේ දී ජම්පර කළුව වශයෙන් හඳුන්වන්නේ,

(1) වර්ෂාවයි. (2) වැහිකබායයි. (3) මාළු දැලයි. (4) සන්ධ්‍යා කාලයයි.

**39.** නුබ සා මඬුලු සඳ වෙල ළපලු පැහැපත
උදය'ග රැක සඳ මල් කැනක සිරි ගත
තර පතරින් සඳ'දර තර පහර දෙත
දිවගත එවි බියෙනැ'ලළෙමිනි දස අත

යන කවියෙන් කියැවෙන්නේ,

(1) වනාන්තරයක අසිරිය පිළිබඳව ය.
(2) වර්ෂා කාලයක් පිළිබඳව ය.
(3) උදෑසන පිළිබඳව ය.
(4) සන්ධ්‍යා කාලයක් පිළිබඳව ය.

**40.** පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන උත්තරය තෝරන්න.

"ලංකාව තුළ ස්වාධීන සභ්‍යත්වයක මුල් බිජුවට සිටුවන ලද්දේ දිවයිනේ ජනාවාස කිරීමට මුල් වූවා සේ සැලකෙන විජය රජු විසින් නොව පළමු වැව කරවූ පණ්ඩුකාභය රජු විසිනි."

(1) නිදහස් ලංකාවක සංස්කෘතියේ ආරම්භය ඇති කළේ විජය රජු නොව පණ්ඩුකාභය රජු ය.
(2) ලක්දිවට අනන්‍ය වූ සභ්‍යත්වයක මූලාරම්භය සිදු කළේ විජය රජු නොව පළමුවන වැව කරවූ පණ්ඩුකාභය රජු ය.
(3) ලක්දිවට අනන්‍ය වූ සභ්‍යත්වයක මූලාරම්භය සටහන් වන්නේ විජය රජුගෙන් නොව පළමුවන වැව කරවූ පණ්ඩුකාභය රජුගෙනි.
(4) විජය රජු ලංකාව ජනාවාස කළත් ලංකාවේ නිදහස් සභ්‍යත්වයක ආරම්භය සිදු වූයේ පණ්ඩුකාභය රජු කරවූ පළමුවන වැව නිසා ය.


**

### 2.1.3 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය


| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | ...2.... | 21. | ...2.... |
| 02. | ..1.... | 22. | ...3.... |
| 03. | ...4.... | 23. | ...3.... |
| 04. | ...3.... | 24. | 1,2,3,4 |
| 05. | ...2.... | 25. | ...4.... |
| 06. | ...4.... | 26. | ...3.... |
| 07. | ...2.... | 27. | ...1.... |
| 08. | ...2.... | 28. | ...4.... |
| 09. | ...1.... | 29. | 1,2,3,4 |
| 10. | ...3.... | 30. | ...2.... |
| 11. | ...4.... | 31. | ...3... |
| 12. | ...1.... | 32. | ...1.... |
| 13. | ...3.... | 33. | ...2.... |
| 14. | ...1.... | 34. | ...4.... |
| 15. | ...4.... | 35. | ...3.... |
| 16. | ...2.... | 36. | ...3.... |
| 17. | ...1.... | 37. | ...1.... |
| 18. | ...2.... | 38. | ...2.... |
| 19. | ...4.... | 39. | ...4.... |
| 20. | ...1,2.... | 40. | ...2.... |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

## 2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (තේමා අනුව)




| තේමාව | පහසුතාව වැඩිම ප්‍රශ්නය හා එහි පහසුතාව | | පහසුතාව අඩුම ප්‍රශ්නය හා එහි පහසුතාව | |
|---|---|---|---|---|
| | ප්‍රශ්න අංකය | පහසුතාව | ප්‍රශ්න අංකය | පහසුතාව |
| භාෂා කුසලතා | 3 | 95% | 21 | 26% |
| ව්‍යාකරණ | 9 | 91% | 8 | 33% |
| භාෂා සාහිත්‍යය | 34 | 37% | - | - |
| විශ්ලේෂණය හා අවබෝධය | 36 | 89% | 40 | 28% |




භාෂා කුසලතා යන තේමාව යටතේ සම්පාදිත 3 වන ප්‍රශ්නයෙහි පහසුතාව 95%කි. එහි පහසුතාව අඩු ම ප්‍රශ්නය වන්නේ 21 වන ප්‍රශ්නය වන අතර, එහි පහසුතාව 26%කි.

ව්‍යාකරණ යටතේ වැඩි ම පහසුතාව පෙන්නුම් කර ඇත්තේ ප්‍රශ්න අංක 9 වන අතර එහි පහසුතාව 91%කි. එහි අවම පහසුතාව ලබා ඇත්තේ 8 වන ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 33%කි.

විශ්ලේෂණය සහ අවබෝධය යටතේ අසා ඇති ප්‍රශ්න අතුරෙන් වැඩි ම පහසුතාව 36 වන ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 89%කි. එම ප්‍රශ්න අතුරෙන් අවම පහසුතාව ලබා තිබුණේ 40 වන ප්‍රශ්නය යි. එය 28%කි.

භාෂා හා සාහිත්‍යය ඇසුරෙන් සැකසී තිබුණේ 34 වන ප්‍රශ්නය පමණි. එහි පහසුතාව 37%කි.

සමස්ත වශයෙන් I ප්‍රශ්න පත්‍රයෙහි මධ්‍යක පහසුතාව 62%කි,

2.1.5 I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තේරූ ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | පළමුවන වරණය | දෙවන වරණය | තෙවන වරණය | සිවුවන වරණය | ප්‍රතිචාර නො දැක්වූ |
| 1 | 2 | 2.6% | **82.9%** | 13.6% | **0.9%** | 0.0% |
| 2 | 1 | **77.0%** | **2.8%** | 3.6% | 16.5% | 0.1% |
| 3 | 4 | 1.4% | 0.6% | **3.0%** | **94.9%** | 0.1% |
| 4 | 3 | **5.9%** | 16.7% | **72.3%** | 4.7% | 0.4% |
| 5 | 2 | 22.6% | **63.1%** | 5.3% | 8.8% | 0.2% |
| 6 | 4 | **4.2%** | 9.4% | 2.8% | **83.5%** | 0.1% |
| 7 | 2 | 13.8% | **62.0%** | 12.9% | **10.6%** | 0.7% |
| 8 | 2 | 28.6% | **32.7%** | 22.6% | 15.7% | 0.4% |
| 9 | 1 | **90.6%** | **4.3%** | 2.6% | 2.4% | 0.1% |
| 10 | 3 | 22.0% | 9.0% | **51.7%** | **16.9%** | 0.4% |
| 11 | 4 | 2.6% | **14.4%** | 14.0% | **68.9%** | 0.1% |
| 12 | 1 | **57.1%** | 25.1% | 11.3% | **6.3%** | 0.2% |
| 13 | 3 | **14.2%** | 16.9% | **54.3%** | 14.2% | 0.4% |
| 14 | 1 | **85.8%** | 6.1% | **1.9%** | 6.1% | 0.1% |
| 15 | 4 | **9.7%** | 7.4% | 5.1% | 77.8% | 0.0% |
| 16 | 2 | 46.6% | **47.3%** | 2.6% | 3.3% | 0.2% |
| 17 | 1 | **53.6%** | 19.7% | 12.2% | 14.1% | 0.4% |
| 18 | 2 | 11.5% | **62.6%** | **11.4%** | 14.2% | 0.3% |
| 19 | 4 | 25.1% | **11.8%** | 9.6% | **53.2%** | 0.3% |
| 20 | 1, 2 | **43.5%** | **37.8%** | 11.2% | 7.2% | 0.3% |
| 21 | 2 | 1.8% | **26.2%** | 39.1% | 32.8% | 0.1% |
| 22 | 3 | 11.0% | 20.6% | **60.7%** | **7.6%** | 0.1% |
| 23 | 3 | **21.9%** | 13.7% | **53.4%** | 10.8% | 0.2% |
| 24 | සියල්ල ම | **23.8%** | **15.2%** | **19.4%** | **41.3%** | 0.3% |
| 25 | 4 | **16.2%** | 21.7% | 15.1% | **45.8%** | 1.2% |
| 26 | 3 | 5.4% | **4.2%** | **77.6%** | 12.7% | 0.1% |
| 27 | 1 | **53.7%** | 40.6% | 3.4% | 2.3% | 0.1% |
| 28 | 4 | 5.8% | 18.9% | 44.1% | **30.8%** | 0.4% |
| 29 | සියල්ල ම | **17.1%** | **25.3%** | **21.2%** | **36.2%** | 0.2% |
| 30 | 2 | 18.1% | **47.2%** | 28.2% | 6.3% | 0.2% |
| 31 | 3 | 9.7% | **10.2%** | **65.9%** | 14.0% | 0.2% |
| 32 | 1 | **65.2%** | 12.2% | 8.5% | **14.0%** | 0.1% |
| 33 | 2 | 13.2% | **57.5%** | 17.5% | 11.4% | 0.3% |
| 34 | 4 | 18.9% | 22.0% | 21.8% | **36.9%** | 0.3% |
| 35 | 3 | 26.9% | 12.6% | **45.9%** | 14.3% | 0.2% |
| 36 | 3 | 2.8% | 2.9% | **89.0%** | 5.1% | 0.1% |
| 37 | 1 | **54.3%** | 16.8% | 21.1% | 7.6% | 0.3% |
| 38 | 2 | 8.5% | **59.3%** | 9.0% | 22.8% | 0.3% |
| 39 | 4 | 18.0% | 7.4% | 35.4% | **39.0%** | 0.1% |
| 40 | 2 | 7.6% | **27.5%** | 30.0% | 34.5% | 0.3% |

### 2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

බහුවරණ ප්‍රශ්න හතළිහකින් සමන්විත මෙම ප්‍රශ්න පත්‍රය මගින් සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිබඳ ව අයදුම්කරුවන් සතු නිරවුල් දැනුම, අවබෝධය, ස්මරණ හැකියාව, භාෂා පරිචය හා භාෂා භාවිතය යන කුසලතා මැන බැලීම හා ඇගයීම අපේක්ෂිත ය.

මෙම බහුවරණ ප්‍රශ්න හතළිහට ම විශේෂයෙන් සැකසුණු ආකෘතියක පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. සිංහල භාෂාව හා සාහිත්‍යය I හා II පත්‍ර දෙකට ම හිමි පැය තුනක කාලයෙන් නිශ්චිත කොටසක් මෙම I පත්‍රයේ ප්‍රශ්න හතළිහට පිළිතුරු සැපයීම සඳහා වෙන් කර නොමැති වුවත්, සාමාන්‍යයෙන් පැය එකක කාලයක් ඒ සඳහා යෙදවීම ප්‍රමාණවත් යැයි අපේක්ෂා කෙරේ.

අංක 8 පිටුවෙහි ප්‍රස්තාර **01**හි දැක්වෙන තොරතුරුවලට අනුව එම ප්‍රශ්න 40 අතුරෙන් **24, 29** යන ප්‍රශ්න සඳහා පහසුතාව 100%කි. ඊට හේතුව නිවැරදි පිළිතුරක් නොතිබීම යි. 20 වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු දෙකක් තිබීම නිසා පහසුතාව 81%ක් වී ඇත. 75%ක පහසුතාව ඉක්ම වූ ප්‍රශ්න ලෙස ප්‍රශ්න අංක **1, 2, 3, 6, 9, 14, 15, 26, 36** දැක්විය හැකි ය. මෙම ප්‍රශ්න පහසුතාව අතින් ඉහළ ම ප්‍රශ්න ලෙස සැලකිය හැකි ය. එනම් මෙම පත්‍රයට පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන් 75%කට වඩා වැඩි පිරිසකට මෙම ප්‍රශ්නවලට නිවැරදි ව පිළිතුරු සැපයීමට හැකි වී තිබේ. එබැවින් එකී ප්‍රශ්න පහසුතම ප්‍රශ්න ලෙස සැලකිය හැකි වෙයි. එම ප්‍රශ්න අතුරෙන් අංක 3 ප්‍රශ්නය වඩාත් ම පහසු ප්‍රශ්නය වී ඇති අතර එහි පහසුතාව 95%ක් වේ.

අංක **4, 5, 7, 10, 11, 12, 13, 17, 18, 19, 22, 23, 27, 31, 32, 33, 37, 38** යන ප්‍රශ්නවල පහසුතාව 50%-75% අතර ප්‍රාන්තරයට අයත් වේ. ඉතිරි ප්‍රශ්නවලට සාපේක්ෂ ව මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සිසුනට පහසු වී ඇත.

අංක **16, 25, 30, 35** යන ප්‍රශ්නවල පහසුතාව 40%-50% අතර ප්‍රාන්තරයට අයත් වේ. අංක 8, 21, 28, 34, 39 හා 40 යන ප්‍රශ්නවල පහසුතාව 40% වඩා පහළ මට්ටමක පවතී.

අංක **21, 40** යන ප්‍රශ්නවල පහසුතාව 30%ට වඩා අඩු වී ඇත. ඉන් පහසුතාව 26%ක් ලබා ගෙන ඇත්තේ **21** වන ප්‍රශ්නයට වන අතර ඊට හේතුව වාග්මාලාව පිළිබඳ දැනුම අල්ප වීමයි. **40** වන ප්‍රශ්නයට පහසුතාව 28%කි. මෙම දුබලතාව මඟහරවා ගැනීම සඳහා පොත පත පරිශීලනය කෙරෙහි ශිෂ්‍යයන් පෙළඹවීම වැදගත් වේ.

සිංහල භාෂාව හා සාහිත්‍යය I ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු බහුවරණ ප්‍රශ්න හතළිහ පහත සඳහන් පරිදි ප්‍රධාන තේමා හතරක් යටතේ වර්ගීකරණය කළ හැකි වෙයි.

| තේමාව | තේමාවට ඇතුළත් ප්‍රශ්න අංක |
|---|---|
| 1. භාෂා කුසලතා | 1, 2, 3, 4, 5, 6, 14, 15, 16, 21, 26, 27 |
| 2. ව්‍යාකරණ | 7, 8, 9, 10, 11, 12, 13, 17, 18, 19, 20, 22, 23, 24, 29, 30, 31, 32 |
| 3. භාෂා සාහිත්‍යය | 34 |
| 4. විශ්ලේෂණය හා අවබෝධය | 25, 28, 33, 35, 36, 37, 38, 39, 40 |

**භාෂා කුසලතා**

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු බහුවරණ ප්‍රශ්න 40 අතුරෙන් ප්‍රශ්න **12**ක් ම ඉදිරිපත් කර තිබුණේ භාෂා කුසලතා තේමාවෙනි. I පත්‍රයට හිමි ලකුණුවලින් 30%ක් මේ සඳහා වෙන් කෙරෙන සේ තේමා අතර බර තබා ඇත. බහුවරණ ප්‍රශ්න **40** අතුරෙන් පහසුතම ප්‍රශ්නය අංක 3 වන අතර එය භාෂා කුසලතා තේමාවට අයත් වේ. එහි පහසුතාව 95%කි.

මෙම තේමාවට අයත් අංක **01, 03, 06, 14** යන ප්‍රශ්නවල පහසුතා පිළිවෙළින් 83%, 95%, 83%, 86% වේ. ඒ අනුව වඩාත් පහසු ප්‍රශ්න හතරක් භාෂා කුසලතා තේමාවෙන් සැකසී ඇත. ඒ සෑම ප්‍රශ්නයක ම පහසුතාව 80% ඉක්මවා තිබිණ.

මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් අසීරු ම ප්‍රශ්නය බවට පත්ව තිබුණේ 21 වන ප්‍රශ්නයයි. එහි පහසුතාව 26%ක් වේ. භාෂා කුසලතා තේමාව යටතේ ඇති ප්‍රශ්න අතුරෙන් අංක **21** ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ පිළිතුරු වඩාත් අසාර්ථක වී ඇත. එම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර අයත් දෙවන වරණය තෝරා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 26.2%ක් පමණි. අයදුම්කරුවන්ගෙන් 1.8%ක් පළමු වරණය ද, 39.1%ක් තුන්වන වරණය ද, 32.8%ක් සිවුවැනි වරණය ද පිළිතුරු ලෙස තෝරා ඇත. මෙම ප්‍රශ්නයෙන් "උපත" යන වචනයට යෙදිය හැකි වඩාත් ම යෝග්‍ය වරණය තෝරා ගැනීම අපේක්ෂිත වුව ද දී ඇති පදවල අර්ථ පිළිබඳ ව නිවැරදි අවබෝධයක් සිසුන් තුළ නොමැති බව පෙනී යයි. "උපත" යන පදයට වඩාත් ම යෝග්‍ය පදය සම්භවය වුව ද එය පිළිබඳ සිසුන් තුළ අවබෝධයක් නො තිබූ බව පෙනේ. පිළිතුර ලෙස වැඩි ප්‍රතිශතයක් තෝරා ගෙන තිබුණේ "පුනරුත්පත්තිය" යන වැරදි පිළිතුර යි.

නියමිත පෙළපොත් මෙන් ම බාහිර පොත පත පරිශීලනයෙන් ඈත්වීම නිසා නිවැරදි පිළිතුර තෝරා ගැනීම ශිෂ්‍යයන්ට ගැටලුකාරී වී ඇත. භාෂාවක් අධ්‍යයනය කිරීමේ දී නිවැරදි ව භාෂාව භාවිත කරමින් රචිත පොත් පත් සඟරා ආදි ලේඛන පරිහරණයෙන් තම වාග් කෝෂය පුළුල් කර ගැනීමට ශිෂ්‍යයන් යොමු විය යුතු ය.

මේ අනුව භාෂා කුසලතා තේමාව යටතේ සැකසී ඇති ප්‍රශ්න 12 සඳහා සමස්ත පහසුතාව 70%කි.

**ව්‍යාකරණ**

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙහි ව්‍යාකරණ තේමාව යටතේ බහුවරණ ප්‍රශ්න 18ක් අඩංගු වූ අතර, මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණුවලින් 45%ක් එම තේමාවට වෙන් වී තිබිණ.

අංක 24, 29 ප්‍රශ්න සඳහා දී ඇති වරණ අතර නිවැරදි පිළිතුරක් නො වූ හෙයින් එම ප්‍රශ්නවල පහසුතාව 100%කි. අංක **24** ප්‍රශ්නය ස්වරාදේශ සන්ධියට උදාහරණයක් නො වූ පදයක් විමසා තිබුණ ද වරණ හතර ම ස්වරාදේශ සන්ධියට අදාළ නිසා නිවැරදි පිළිතුර තෝරා ගැනීමේ දී අයදුම්කරුවන් අපහසුතාවට ලක් වී ඇති බව පෙනේ. ඒ අනුව අයදුම්කරුවන්ගේ පිළිතුරු පිළිවෙළින් 24%, 15%, 19%, 41% ලෙස 1 - 4 දක්වා වරණ අතර විසිරී තිබිණ.

අංක 29 ප්‍රශ්නය, ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍යය තේරීමට තිබුණ ද දී තිබුණ වරණ අතර නිවැරදි වාක්‍යයක් නො තිබිණ. ඒ සඳහා අයදුම්කරුවන්ගේ පිළිතුරු පිළිවෙළින් 17%, 25%, 21%, 36% ලෙස 1 - 4 දක්වා වරණ අතර විසිරී තිබිණ.

අංක 20 ප්‍රශ්නය සඳහා පහසුතාව 81%කි. එම ප්‍රශ්නයට නිවැරදි වරණ දෙකක් තිබුණි.

එනිසා ව්‍යාකරණ තේමාවට අයත් ප්‍රශ්න 18 අතුරෙන් වැඩි ම පහසුතාව ඇත්තේ **9** වැනි ප්‍රශ්නයට යි. එහි පහසුතාව 91%කි. මෙම තේමාව යටතේ ඇති අනෙකුත් පහසු ප්‍රශ්න ලෙස සැලකිය හැකි අංක **11, 31, 32** ප්‍රශ්නවල පහසුතා පිළිවෙළින් 69%, 66%, 65% වේ.

ව්‍යාකරණ තේමාව යටතේ අයදුම්කරුවන්ට දුෂ්කර ම ප්‍රශ්නය වී ඇත්තේ **8** වන ප්‍රශ්නය යි. එහි පහසුතාව 33%කි. මෙම ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුර අයත් වන්නේ දෙවන වරණයට වුවත් එය තෝරා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 32.7%ක් පමණ වන අතර, අයදුම්කරුවන්ගෙන් 28.6%ක් පළමු වන වරණය ද, 22.6%ක් තෙවන වරණය ද, 15.7%ක් සිවුවන වරණය ද තෝරා ඇත. අක්ෂර වින්‍යාස රීති පිළිබඳ ව අයදුම්කරුවන් තුළ ඇති අනවබෝධය මෙහි දී කැපී පෙනේ. එබැවින් අක්ෂර වින්‍යාසය පිළිබඳ ව ප්‍රමාණවත් අවබෝධයක් ඇති කිරීමට පන්ති කාමරය තුළ දී විවිධ ක්‍රියාකාරකම්වල යෙදවීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

**භාෂා සාහිත්‍යය**

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයේ භාෂා සාහිත්‍යය තේමාව ඇසුරෙන් සකස් වී ඇත්තේ 34 වන ප්‍රශ්නය පමණි. රූපක මූලික කරගත් ප්‍රශ්නයක් වූ එහි පහසුතාව 37%කි. මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණුවලින් 2.5%ක් මෙම තේමාවට වෙන් වී තිබිණ.

අයදුම්කරුවන්ගෙන් 37%ක් පමණක් මෙම ප්‍රශ්නයට නිවැරදි ව පිළිතුරු සැපයීමෙන් අනාවරණය වන්නේ අයදුම්කරුවන්ගෙන් අඩකට වැඩි ප්‍රමාණයක් නිවැරදි පිළිතුර තෝරා ගැනීමට අසමත් ව ඇති බව ය.

මේ නිසා අයදුම්කරුවන් තුළ සාහිත්‍යමය යෙදුම් පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා සාහිත්‍ය පොත පත පරිශීලනය තවදුරටත් වර්ධනය කරවීම පිණිස සුදුසු ක්‍රමවේද යොදා ගත යුතු ය.

**විශ්ලේෂණය හා අවබෝධය**

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙහි විශ්ලේෂණය හා අවබෝධය තේමාව යටතේ ප්‍රශ්න 9ක් අඩංගු වී තිබුණි. I පත්‍රයට හිමි ලකුණුවලින් මෙම තේමාව සඳහා 22.5%ක බර තැබීමක් සිදුකර ඇත. මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් වැඩි ම පහසුතාව **36** වන ප්‍රශ්නයට හිමි වී ඇති අතර එහි පහසුතාව 89%කි. මෙම තේමාව යටතේ ඇති දුෂ්කර ම ප්‍රශ්නය ලෙස අංක **40** සැලකිය හැකි ය. එම ප්‍රශ්නයේ පහසුතාව 28%කි. මෙම ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුර වන දෙවන වරණය තෝරා ගත් අයදුම්කරුවන් ප්‍රමාණය 27.5%කි. 72.5%ක ප්‍රමාණයක් වැරදි වරණ තෝරා ගෙන තිබිණ.

අංක 28 ප්‍රශ්නයට ද නිවැරදි පිළිතුරු සැපයීමට අයදුම්කරුවන්ගෙන් වැඩි පිරිසක් අපොහොසත් ව ඇත. එම ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සැපයීමට සමත් වූයේ අයදුම්කරුවන්ගෙන් 31%කි. එසේ ම 69%ක් නිවැරදි පිළිතුර සැපයීමට අසමත් වී ඇත. අයදුම්කරුවන් වැඩි පිරිසක් නිවැරදි පිළිතුර සැපයීමට අසමත් වී ඇත්තේ පෙළ පොත අධ්‍යයනය කිරීමෙන් ලැබූ දැනුම හා අවබෝධය අව ම මට්ටමක පැවතීම බව පෙනී යයි.

අංක **25, 35, 39** යන ප්‍රශ්න සඳහා පහසුතාව 50% වඩා අඩු වී ඇත. **10** සහ **11** ශ්‍රේණිවල සිංහල භාෂාව සහ සාහිත්‍යය පෙළපොත් ආශ්‍රිත ව මෙම ප්‍රශ්න සකස් කෙරුණ ද එම ග්‍රන්ථ මනාව පරිශීලනය නො කිරීම නිසා නිවැරදි පිළිතුර තෝරා ගැනීමට නො හැකි වී ඇත.

එබැවින් විශ්ලේෂණය හා අවබෝධය යටතේ ඇති ප්‍රශ්නවලින් ඉහළ ලකුණු ලබා ගැනීම සඳහා ඉහත සඳහන් අඩුපාඩු මග හරවා ගැනීම සඳහා ගුරු-සිසු අවධානය යොමුවීම අත්‍යවශ්‍ය වේ.

| තේමාව | තේමාවට ඇතුළත් වී ඇති ප්‍රශ්න සංඛ්‍යාව | බර තැබීම | තේමාවේ පහසුතාව |
|---|---|---|---|
| 1) භාෂා කුසලතා | 12 | 30% | 70% |
| 2) ව්‍යාකරණ | 18 | 45% | 64% |
| 3) භාෂා සාහිත්‍යය | 01 | 2.5% | 37% |
| 4) විශ්ලේෂණය හා අවබෝධය | 09 | 22.5% | 50% |

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙහි සමස්ත පහසුතාව 62%ක් වේ. එනම් මෙම පත්‍රයට පෙනී සිටි අයදුම්කරුවන් සමස්තයක් වශයෙන් ගත් කල, ඔවුන් උපයා ගෙන ඇත්තේ එම පත්‍රයට උපයා ගත හැකි ව තිබූ උපරිම ලකුණුවලින් 62%ක් පමණි. එයින් ගම්‍ය වන්නේ සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙන් ඉහළ ලකුණු ලබා ගැනීම අයදුම්කරුවන්ට පහසු වී නොමැති බව යි.

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **පහකින්** සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

1. ප්‍රශ්නය : භාෂා පරිචය ඇගයීම සඳහා සකස් කරන ලද කෙටි පිළිතුරු සැපයීමේ කොටස් 10කින් සමන්විත වේ.
එක් කොටසකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20කි.

2. ප්‍රශ්නය : ව්‍යුහගත තේමා හතරක් අතුරෙන් එකක් තෝරා ගෙන, දෙන ලද වචන සීමාවක් යටතේ රචනයක් ලිවිය යුතු වේ. තෝරා ගනු ලැබූ රචනා ව්‍යුහයට වඩාත් අදාළ වන සාරවත් කරුණු හඳුනා ගෙන නිර්මාණාත්මක ලෙස සංවිධානය කර ඉදිරිපත් කිරීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 25 කි.

3. ප්‍රශ්නය : දෙන ලද පාඨයක, සාරාංශය, නියමිත වචන සීමාව තුළ ලිවිය යුතු ය.
පාඨයක ඇතුළත් කරුණු සංශ්ලේෂණය කිරීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 10 කි.


4. ප්‍රශ්නය : දෙන ලද ඡේදයක් ඇසුරෙන් විමසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සැපයිය යුතු ය.
අවබෝධය මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 10 කි.

5. ප්‍රශ්නය : දී ඇති අවශ්‍යතාවලට ගැළපෙන සේ අදාළ ඉල්ලීමක් අඩංගු ලිපියක් හෝ අදාළ තොරතුරු අඩංගු අත් පත්‍රිකාවක් හෝ ලිවිය යුතු වේ. ප්‍රායෝගික ලේඛන කුසලතා මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 15 කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 80

2.2.2 **II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ අංක 2, 3 හා 4 ප්‍රස්තාර ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. එක් එක් ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.




(RD/16/04/OL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

සිංහල භාෂාව හා සාහිත්‍යය II පත්‍රයෙහි ඇති ප්‍රශ්න පහට ම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. එහෙත් අයදුම්කරුවන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබුණේ පළමු ප්‍රශ්නයට වන අතර අඩු ම ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබුණේ 5 වන ප්‍රශ්නයට ය. එම ප්‍රතිශත පිළිවෙළින් 98% හා 92% වේ. අයදුම්කරුවන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් පළමු වන ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබූ නමුත් වැඩි ම පහසුතාවක් ඇත්තේ 4 වන ප්‍රශ්නයට ය. දී ඇති ඡේදයක් ඇසුරෙන් නගන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සැලැස්වීමෙන් සිසුන්ගේ අවබෝධ හැකියාව මැනීම මෙම ප්‍රශ්නයේ අරමුණ වී ඇත.

ප්‍රශ්න පහ අතුරෙන් 1 වන ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 98%කට ආසන්න ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබූ නමුදු එම ප්‍රශ්නයෙහි පහසුතාව 60%ක් වේ. සරල ව්‍යාකරණ රීතිවලින් සමන්විත මෙම ප්‍රශ්නයට ලකුණු 20ක් හිමි වේ. එහෙත් වියරණ පිළිබඳ මූලික දැනුම හා අවබෝධය අවම වීම ලකුණු අඩුවීමට හේතු වී ඇත.

01. ප්‍රශ්නය

අපේක්ෂණය : භාෂා පරිචය ඇගයීම
ව්‍යුහය : මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුරු අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ **උත්තර නොලියන්නේ** නම්, එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) සිංහල හෝඩියේ ඇතුළත්
**(අ)** සඤ්ඤක **(ආ)** ඌෂ්ම
අක්ෂරය බැගින් ලියන්න.

(ii) පහත සඳහන් පද විසන්ධි කොට ලියන්න.
**(අ)** වියවුල් **(ආ)** ගංදිය

(iii) පහත සඳහන් වාක්‍යයේ වචන **දෙකක** අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන **දෙක** පමණක් නිදොස් කර ලියන්න.
"විශිෂ්ඨ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් මෙරට අපරාධ මර්ධනය කළ හැකි ය."

(iv) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
**(අ)** උපද්‍රව **(ආ)** උත්තම

(v) පහත සඳහන් පද්‍ය ඛණ්ඩයෙහි ඇතුළත් කෘදන්ත පද **දෙකක්** ලියන්න.
"දුම්බර කෙතට වැට බැඳලා රැකුම් බැලුම්"

(vi) පහත සඳහන් **(අ)** සහ **(ආ)** හි දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
**(අ)** වෛද්‍යවරුන් රෝහලේ ඇත.
**(ආ)** ගුරුවරු සමග ශිෂ්‍යයෝ ද ශ්‍රමදානයට සහභාගි වූහ.

(vii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් සමාස පද **දෙක** නම් කරන්න.
"අධ්‍යාපන චාරිකාවට සහභාගි වූ දරුදැරියෝ ඉමිහිරි ගී ගයමින් විනෝද වූහ."

(viii) පහත සඳහන් **(අ)** සහ **(ආ)** යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
**(අ)** දැවයෙන් කරන ලද
**(ආ)** රාත්‍රියෙහි හැසිරෙන

(ix) පහත සඳහන් වාක්‍ය **දෙක** කර්මකාරකයට හරවා ලියන්න.
**(අ)** දන්ත වෛද්‍යවරු මුඛ රෝග පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කළහ.
**(ආ)** නළුනිළියෝ විචිත්‍රවත් රංගනයක යෙදෙමින් ප්‍රේක්ෂකයින් සතුටට පත් කරති.

(x) පහත දැක්වෙන වාක්‍යයේ ඇතුළත් යුගල පද **දෙක** තෝරා වෙන වෙන ම ලියන්න.
"වතු පිටි විනාශ කරමින් ගම් වැදුණු වන අලි රංචුව දැකීමෙන් මාගේ මිත්‍රයා තක්කු මුක්කු වූයේ ය."

(ලකුණු $2 \times 10 = 20$ යි)

අපේක්ෂිත පිළිතුර හා ලකුණු දීමේ පටිපාටිය

1. (i) (අ) ග ජ ඩ ද ඹ
(ආ) ශ ෂ ස හ *(අ)ඃ /ඃ

(ii) (අ) වි + අවුල්
(ආ) ගඟ + දිය

(iii) විශිෂ්ට , මර්දනය

(iv) (අ) නිරුපද්‍රව / අනුපද්‍රව / ශාන්තිය / සෙත / යහපත
(ආ) අධම / නීච / පහත් / නිහීන / තුච්ඡ / හීන

(v) රැකුම්, බැලුම්

(vi) (අ) වෛද්‍යවරු රෝහලේ ඇත.
(ආ) ගුරුවරුන් සමග ශිෂ්‍යයෝ ද ශ්‍රමදානයට සහභාගි වූහ.

(vii) දරුදැරියෝ, ඉමිහිරි


(viii) (අ) දැවමුවා / දාරුමය / දැවමය
(ආ) නිශාචර

(ix) (අ) දන්ත වෛද්‍යවරුන් විසින් මුඛ රෝග පිළිබඳව පාසල් සිසුහු දැනුවත් කරන ලදහ./ ලද්දෝය./ ලැබූහ./ ලැබුවෝය/ කරනු ලැබූණහ. / දැනුවත් කෙරුණු. / දැනුවත් කෙරුණහ.

(ආ) නළුනිළියන් විසින් විචිත්‍රවත් රංගනයක යෙදෙමින් ප්‍රේක්ෂකයෝ සතුටට පත් කරනු ලබති./ ලබන්නෝ ය. / ලබන්නාහු ය. / පත් කෙරෙති. / කෙරෙත් / කරනු ලැබෙති.


(x) වතුපිටි, තක්කුමුක්කු

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා




මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර අපේක්ෂකයන්ගෙන් 98%ක පිරිසක් පිළිතුරු සපයා ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 11%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 34%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 26% වන අතර 11%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.




සිංහල භාෂාව හා සාහිත්‍යය II පත්‍රයෙහි පළමු වන ප්‍රශ්නය කොටස් 10ක් යටතේ අනු කොටස් 16කින් සමන්විත වූ අතර වැඩි ම පහසුතාව ඇත්තේ (x) වන කොටසට ය. එහි පහසුතාව 91%කි. මෙම ප්‍රශ්නයෙන් යුගල පද පිළිබඳ අවබෝධය මැනෙයි. ප්‍රායෝගික දිවියේ නිරතුරුව ම භාවිත වන යුගල පද පිළිබඳ විමසා තිබීම මෙම පිළිතුරෙහි පහසුතාවට හේතු වී ඇත.

දෙවනුව වැඩි පහසුතාව වන 87%ක් ලබා ගෙන ඇත්තේ **(i)** (අ) අනුකොටස යි. සඤ්ඤක අක්ෂර පිළිබඳ අවබෝධය නිවැරදි ව ලබා තිබීම මෙම ප්‍රශ්නය පහසුවීමට හේතු වී ඇත. මෙහි (ආ) අනුකොටසට පහසුතාව 74%කි. මෙමගින් පැහැදිලි වන්නේ සඤ්ඤක අක්ෂර පිළිබඳ ව අපේක්ෂකයන් සතු දැනුමට සාපේක්ෂව ඌෂ්මාක්ෂර පිළිබඳ ව තිබූ දැනුම අඩු බව ය.

තෙවනුව වැඩි පහසුතාව වන 80% ලබා ගෙන ඇත්තේ **(viii)** කොටස (ආ) අනුකොටස ය. එහි (අ) අනු කොටස සඳහා පහසුතාව ද 76%කි. ප්‍රායෝගික ජීවිතයේ දී නිරතුරුව ම භාවිත වන තනි පද පිළිබඳ ව මෙම ප්‍රශ්නය සැකසී ඇති බැවින් පහසුතාව සතුටුදායක මට්ටමක පවතී.

එමෙන් ම මෙහි (i) හි (ආ), (ii) (ආ), (iii), (v), (vi) අ, (vii) යන කොටස්වලට පහසුතාව 50%-75% ප්‍රාන්තරයේ පැවතිණි.

එසේ ම මෙම ප්‍රශ්නයේ දුෂ්කර ම කොටස වී ඇත්තේ පහසුතාව 25%ක් වූ (ii) (අ) අනුකොටස යි. සිංහල භාෂාවේ සන්ධි අතුරෙන් ආගම සන්ධිය පිළිබඳ අපේක්ෂණයන් හා අවබෝධය ප්‍රමාණවත් නොවීම ඊට හේතුව වී ඇත.

(ix) (අ) හා (ආ) ද, (iv) (අ) හා (ආ) ද යන අනුකොටස්වල පහසුතාව 27% සිට 39% දක්වා විසිරී ඇත. වියරණ රීති හා විරුද්ධාර්ථ පද පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවන බව මෙමගින් පැහැදිලි වේ.

සන්ධි, විරුද්ධාර්ථ පද හා කර්මකාරක වාක්‍ය වැනි වියරණ පිළිබඳ දැනුම අයදුම්කරුවන් තුළ වර්ධනය කළ යුතු බවත්, ව්‍යවහාරික භාෂාවේ යෙදෙන විශේෂිත පද පිළිබඳ නිරවුල් අවබෝධය පුළුල් කළ යුතු බවත් මෙහි දී පැහැදිලි වේ. භාෂා පරිචය යටතේ ලේඛන කුසලතාව, භාෂණ අවබෝධය හා විශ්ලේෂණය කිරීම, භාෂා භාවිතය, ග්‍රන්ථ පරිහරණය හා වාක්‍ය අවබෝධය යන කරුණු මැනීම මෙයින් අපේක්ෂා කළ ද අයදුම්කරුවන් තුළ ව්‍යාකරණ පිළිබඳ මූලික දැනුම හීන වීමත් අවබෝධය පිළිබඳ දුර්වලතාත් දක්නට ලැබේ. මේ සඳහා ව්‍යාකරණ ග්‍රන්ථ පරිශීලනයටත්, වියරණ දැනුම වැඩි දියුණු කර ගැනීමටත් පෙළපොත් හා අමතර ග්‍රන්ථ පරිශීලනයටත් අයදුම්කරුවන් උනන්දු කරවිය යුතු අතර සිංහල ව්‍යාකරණ පිළිබඳ සමස්ත අවබෝධය පුළුල් කිරීම උදෙසා ශිෂ්‍යයා සතතාභ්‍යාසවල යෙදවීමට ගුරුභවතුන්ගේ විශේෂ අවධානය යොමු විය යුතු ය.

## 2 ප්‍රශ්නය

අපේක්ෂණය : සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා මැන බැලෙන්නකි. දෙන ලද ව්‍යූහගත ජේද හතරෙන් එකක් යටතේ රචනාවක් ලිවීමත්, යෝග්‍ය මාතෘකාවක් යෙදීමත් අපේක්ෂා කෙරේ. මෙහි දී අපේක්ෂකයාගේ නිර්මාණ හා චින්තන ශක්තිය, ලේඛන කුසලතාව, නිරවුල් භාෂා භාවිතය, සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැන බැලීම ආදි අරමුණු කෙරෙහි අවධානය යොමු වෙයි. මාර්ගෝපදේශිත රචනා මූලධර්මය මෙහි දී අනුගමනය කර ඇත.

**2.** පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

**(අ)** ශ්‍රී ලංකාවේ වන අලි බෝවීමේ ප්‍රවණතාව ඉහළ යෑම හා ඔවුන් පාලනය කිරීමේ ක්‍රමෝපායයන් පිළිබඳව මේ දිනවල විවිධ අදහස් පළ වේ. බොහෝ කාලයක පටන් මෙරට පවතින අලි-මිනිස් ගැටුම හේතුවෙන් අලින්ගේ සහ මිනිසුන්ගේ ජීවිත මෙන් ම දේපළවලට ද සිදු වන හානිය ගණනය කළ නොහැකි තරම් ය. එනිසා වන අලි මෙරටට සම්පතක් බවට පත්කර ගැනීමේ උපක්‍රම පිළිබඳව පරිසරවේදීන්ගේ අවධානය යොමු විය යුතු ය.

**(ආ)** ජනගහනය අධික වීම මෙන් ම නියඟ හා ගංවතුර වැනි ස්වාභාවික ආපදා හේතුවෙන් ආහාර අර්බුදයක් හට ගනිමින් තිබීම සමස්ත ලෝක ප්‍රජාවට ම මුහුණ දීමට සිදුව ඇති අභියෝගයකි. කෘෂිකර්මාන්තය අතහැර වෙනත් වෘත්තීන්වල නියැලීමට මිනිසුන් පෙලඹීම ද මේ තත්ත්වය ඇති වීමට බලපා තිබේ. මේ අර්බුදයට විධිමත් හා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු ය.

**(ඉ)** ලොව බොහොමයක් රටවල නිදහස් සෞඛ්‍ය සේවාවක් නොමැත. රෝගීන් සිය පෞද්ගලික වියදමෙන් ප්‍රතිකාර හා ඖෂධ ලබාගත යුතු ය. ශ්‍රී ලංකාව නිදහස් සෞඛ්‍ය සේවාවක් පවතින රටක් වුවත් ඖෂධ නිෂ්පාදන සමාගම් අතර පවතින තරගකාරිත්වය හා ඖෂධවල මිල ගණන් ඉහළ පහළ යෑම නිසා එහි ප්‍රතිලාභ සාමාන්‍ය ජනතාවට සම්පූර්ණයෙන් ම නොලැබෙන බවට ඔවුහු මැසිවිලි නගති. ඒ අනුව නිදහස් සෞඛ්‍ය ප්‍රතිපත්තියේ ප්‍රතිලාභ සාමාන්‍ය ජනයාට අත්වන අන්දමේ ක්‍රියා පිළිවෙතක් සකස් කිරීම කාලීන අවශ්‍යතාවකි.

**(ඊ)** ළමයින්ගේ පෞරුෂ සංවර්ධනයේ දී අතීතයේ විසූ වීරවරයන්ගේ සහ වීරවරියන්ගේ චරිතාපදානවලින් සැපයෙන පිටුබලය ඉමහත් ය. මෙරට රූපවාහිනී නාළිකා ඔස්සේ ප්‍රචාරය වන හරසුන් ටෙලිනාට්‍ය සහ කාටූන් වැඩසටහන් වෙනුවට වීර චරිත තේමා කර ගැනුණු නාට්‍ය නිෂ්පාදනය කිරීමෙන් ළමයින්ගේ කලා රසඥතාව වර්ධනය කිරීමට මෙන්ම ඉතිහාසය පිළිබඳ දැනුම ලබාදීමට ද හැකිවනු ඇත.

(ලකුණු 25 යි)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

එක් එක් විස්තරයට අදාළ වන්නේ පහත සඳහන් ප්‍රධාන අදහස් ය.

(අ)
- වන අලි මෙරට සම්පතක් බවට පත්කර ගැනීමේ උපක්‍රම
- අලි මිනිස් ගැටුම් නිසා ඇති වන හානි
- වන අලි වර්ධනය පාලනය කිරීමේ ක්‍රමෝපාය

(ආ)
- ස්වාභාවික ආපදා නිසා ඇති වන ආහාර අර්බුදයට විධිමත් හා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු ය.
- ස්වාභාවික ආපදා වළක්වා ගැනීමේ උපාය මාර්ග
- ස්වාභාවික ආපදා හේතුවෙන් සමස්ත ලෝක ප්‍රජාව මුහුණ දෙන අභියෝග
- ජනගහනය අධික වීම හා ස්වාභාවික ආපදා

(ඉ)
- නිදහස් සෞඛ්‍ය සේවාව විධිමත් කිරීමේ ක්‍රියාමාර්ග
- නිදහස් සෞඛ්‍ය සේවයේ ප්‍රතිලාභ සාමාන්‍ය ජනතාවට ලබාදීමේ ක්‍රියාමාර්ග

(ඊ)
- කලා රසාඥතාව හා ඉතිහාසය පිළිබඳ දැනුම නාට්‍ය නිෂ්පාදනය මගින් ළමා මනසෙහි ජනිත කිරීම
- වීර චරිත තේමා කොට ගත් ටෙලි නාට්‍ය නිෂ්පාදනයෙන් ළමා පෞරුෂය වර්ධනය කිරීම
- ළමා පෞරුෂ වර්ධනයට අතීත විරුවන්ගේ චරිත මගින් ගත හැකි ආදර්ශ

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25 යි රචනය හොඳින් කියවා ලකුණු දෙන්න.

1. සාරවත් භාවය, මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08 යි
2. සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි
3. ශිල්පීය දක්‍ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි

01. සාරවත්භාවය - ලකුණු 07 යි
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01 යි

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250ට සමීපව පැවැතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි

මෙහිදී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්‍ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි

වියරණ, අත් අකුරු, විරාම ලක්‍ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.


සැලකිය යුතුයි :

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දැක්වූ 1, 2, 3 යන කොටස්වලට අනුපාතික ව ලකුණක් තීරණය කෙරේ.
02. වැදගත් අදහස් හා සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (√) යොදන්න. වැරදි තැන්වල (x ) ලකුණු යොදන්න.
03. උක්ත ආඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.
04. 1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර මුළු ලකුණු ලබාගන්න.


නිදසුන් $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්‍ෂ්‍යය : වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස් කර ගන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නො වන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

## 2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්‍ෂණ, නිගමන හා යෝජනා




මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 97%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් වෙන් කර ඇත.
ඉන් ලකුණු 00 - 06 ප්‍රාන්තරයේ 6%ක් ද,
ලකුණු 07 - 12 ප්‍රාන්තරයේ 18%ක් ද,
ලකුණු 13 - 18 ප්‍රාන්තරයේ 54%ක් ද,
ලකුණු 19 - 25 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 13ට අඩුවෙන් ලබා ගත් අයදුම්කරුවන් ප්‍රමාණය 24%කි. ලකුණු 19-25 අතර ලබා ගත් ප්‍රමාණය 22%කි. සමස්තයක් වශයෙන් ගත් කල අයදුම්කරුවන්ගෙන් 76%ක් රචනා ප්‍රශ්නයට 13-25 අතර ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයෙහි (අ), (ආ), (ඉ) සහ (ඊ) යටතේ පිළිවෙළින් "අලි මිනිස් ගැටුම නිසා ඇතිවන හානි", "ස්වාභාවික ආපදා වළක්වා ගැනීමේ උපාය මාර්ග", "නිදහස් සෞඛ්‍ය සේවාව විධිමත් කිරීමේ ක්‍රියාමාර්ග", "ළමා පෞරුෂ වර්ධනයට අතීත විරුවන්ගේ චරිත මගින් ගත හැකි ආදර්ශ" යන මාතෘකා පදනම් කර ගනිමින් මාර්ගෝපදේශිත රචනා සඳහා විස්තරාත්මක ව්‍යුහගත ඡේද හතරක් ඉදිරිපත් කර තිබුණි.

එයින් වැඩිම පහසුතාව වූ 64%ක අගයක් පෙන්නුම් කර ඇත්තේ "ළමා පෞරුෂ වර්ධනයට අතීත විරුවන්ගේ චරිත මගින් ගත හැකි ආදර්ශ" යන්න තේමා කර ගත් රචනය වන අතර අඩු ම පහසුතාව වූ 55%ක් අගය ලබා ඇත්තේ "අලි මිනිස් ගැටුම නිසා ඇතිවන හානි" යන්න තේමාව කර ගත් රචනයයි.

සමස්තයක් ලෙස ගත් කල ප්‍රශ්නයෙහි මධ්‍යක පහසුතාව 60%ක් වන බැවින් රචනා ලිවීමේ නිපුණතාව අයදුම්කරුවන් තුළ තව තවත් වර්ධනය කළ යුතු බව පැහැදිලි ය. ස්වකීය අදහස් නිදහස් ව හා නිර්මාණාත්මක ව ජනනය කරවීමටත් ඒවා විධිමත් ව, සංවිධානාත්මක ව නිරවුල් ව හා ව්‍යාකරණානුකූල ව ඉදිරිපත් කිරීමටත් ශිෂ්‍යයන් යොමු කළ යුතු ය.

රචනා මාතෘකාව හඳුනා ගැනීමට උපයෝගි කර ගැනීම සඳහා දී ඇති ඡේදයෙහි කරුණු සැලකිල්ලට ගෙන රචනාවට අදාළ සැකිල්ල සකස් කර ගැනීමත් කරුණු සංවිධානය කර ගැනීමත් අපේක්‍ෂකයන්ට පහසු වේ. සම්භාව්‍ය ගද්‍ය පද්‍ය පොත පත කියවීම ද, විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය පරිශීලනය කිරීම ද, අන්තර්ජාලය ඇසුරෙන් නව ලෝකය පිළිබඳ ව රැස් කර ගත හැකි කරුණු ද සාර්ථක රචනා නිර්මාණය කිරීම සඳහා මහඟු අත්වැලක් කර ගත හැකි ය.

අලි මිනිස් ගැටුම හා ඒ නිසා ඇති වන හානි පිළිබඳ අපේක්ෂකයන් විස්තර ලියා තිබුණත් ව්‍යූහගත ඡේදයේ ඇතුළත් වන, වන අලි මෙරට සම්පතක් කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කරමින් තොරතුරු අන්තර්ගත වන පරිදි කරුණු පෙළ ගැස්වා ඇත්නම් ඉහළ ලකුණක් ලබා ගැනීමේ හැකියාව තිබිණි.

එසේම කාලීන ගැටලු පිළිබඳ අවබෝධයත්, එවැනි මාතෘකාවලට අනුව කරුණු ගොනු කර ලිවීමටත් ශිෂ්‍යයන් යොමු කිරීමත් අවශ්‍ය වේ.

පහසුතාව 64% ක් වූ (ඊ) කොටසේ ඇති රචනය තරමක් දුරට පහසු වී ඇත්තේ අපේක්ෂකයන් චරිතාපදාන කතා පිළිබඳ අවබෝධයෙන් යුක්ත වූ බැවිණි. වීර චරිත තේමා කර ගත් රචනා ලිවීමට ළමා පරපුර වැඩි නැඹුරු වීමත් දක්වන බව මින් ගම්‍ය වේ.

අතීත චරිතාපදාන කතා සහිත කෘති පරිශීලනය කරමින් පුරාවෘත්ත පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීමට ශිෂ්‍යයන්ට මග පෙන්වීම කළ යුතු වේ.

දී ඇති රචනා ව්‍යූහ අතරෙන් (අ) මාතෘකාව සඳහා අපේක්ෂකයන්ට මග පෙන්වීමක් වශයෙන් රචනා ආදර්ශනයක් පහත දක්වා ඇත.

2. (අ) ***වන අලි මෙරට සම්පතක් බවට පත් කර ගැනීමේ උපක්‍රම***

*ලෝකයේ අනෙකුත් රටවල වෙසෙන අලි අතර ශ්‍රී ලංකාවේ ජීවත් වන අලියා පුෂ්ටිමත් බවෙන් හා සෞන්දර්යාත්මක බවෙන් ද ඉදිරියෙන් සිටින බව පිළිගත් සත්‍යයකි. දැන් දැන් ශ්‍රී ලංකාව තුළ වන අලි බෝවීමේ ප්‍රවණතාව ඉහළ අගයක් ගන්නා බව වනජීවී දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරන සංඛ්‍යා ලේඛන සාක්ෂ්‍ය දරයි. 2010-2017 වර්ෂ වන විට වන අලි බෝවීම සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගොස් ඇති අයුරු එම සංඛ්‍යා ලේඛන විමසන්නෙකුට පැහැදිලි ව හඳුනා ගත හැකි වෙයි.*

*වන අලි බෝවීම වර්ධනය වීමත් සමග ම අලි-මිනිස් ගැටුම් ද හේතුවෙන් අලින්ගේ හා මිනිසුන්ගේ ජීවිතවලට මෙන් ම දේපළවලට ද සිදු වන හානිය දිනෙන් දින උග්‍ර අතට ම හැරී ඇති බව නම් නොරහසකි. මිනිසා තම වගාවන්ට හානි කරන වන අලි දෙස බලන්නේ දැඩි වෛරයෙනි. හේතුව තම ජීවනෝපාය හා සහචරයන්ගේ ජීවිතවලට අලින්ගෙන් වන තර්ජන ඉවසා සිටීම කෙසේවත් කළ නොහැකි වීමයි. මේ නිසා ඇතැම් අවස්ථාවල අලින්ට ද තම ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදු වනවා පමණක් නො ව සදාකාලික අබ්බගාතයන්, රෝගීන් වන්නට ද සිදු වෙයි. ඇතැම් නියඟ කාලවලට මෙන් ම ඇතැම් මිනිසුන්ගේ අදූරදර්ශී ක්‍රියාකලාපය නිසා ද වනයේ ජීවත් වන අලි ගම් වදිති. එලෙස ගම් වදින වන අලින් වෙතින් මිනිසුන්ගේ වගාවන්ට සිදු වන්නේ ගණනය කළ නොහැකි විනාශයකි.*

*වන අලින්ගේ ගම් වැදීම වැළැක්වීමට රජය විදුලිය වැට යෙදීම වැනි විවිධ උපාය මාර්ග යෙදුව ද තවමත් මෙම ගැටුමට ස්ථිරසාර විසඳුමක් ලැබී ඇති බවක් නම් නො පෙනෙයි. වන අලි බෝවීම ඉහළ යාමත් සමග ප්‍රශ්නය ද උග්‍ර අතට ම හැරී ඇත. එසේ නම් මෙම ප්‍රශ්නය විසඳීමට නව ක්‍රමවේද සෙවීමට රජය මෙන් ම රටේ ජීවත් වන සාමාන්‍ය වැසියා ද උත්සුක විය යුතු කාලය දැන් එළඹ ඇත.*

*සංචාරක ආකර්ෂණය දිනා ගෙන ඇති අප රටේ අලි, විදෙස් විනිමය උපයා ගැනීමට නිධානයක්, සම්පතක් කර ගැනීම කෙරේ අවධානය යොමු කිරීම මෙහි දී වඩාත් ප්‍රයෝජනවත් වෙයි. යාල, උඩවලව, විල්පත්තු ආදී වනෝද්‍යාන හා අභය භූමි තුළ නිදහසේ වෙසෙන වන අලි නැරඹීමට දේශීය මෙන් ම විදේශීය සංචාරකයන්ට ද පහසුකම් වැඩි කිරීම අවශ්‍ය ය. එමගින් විදේශ විනිමය පහසුවෙන් උපයා ගත හැකි මාර්ගයක් ද සකසා ගත හැකි ය. එක් ස්ථානයක දී විශාල වශයෙන් අලි-ඇතුන් නැරඹීමට කෑගල්ල ඇත්අතුරු සෙවණ වැනි ස්ථාන රටේ විවිධ ප්‍රදේශවල ස්ථාපනය කිරීම තුළින් ද ප්‍රතිලාභ රටට උපයා ගැනීමට පිළිවන.*

*වන අලි ගැවසෙන වනාන්තර හා අභය භූමි තුළ ඔවුන්ට නිදහසේ ජීවත් වීමට අවශ්‍ය ආහාර හා ජලය වැනි පහසුකම් තර කරදීම මගින් ද, තව තවත් ඔවුන්ගේ ජීවත්වීම උදෙසා භූමි ප්‍රමාණය වැඩි කිරීමෙන් ද ඔවුන්ගේ ගම් වැදීම නවතාලිය හැකි ය. එවිට තවදුරටත් වන අලි ගහණය වැඩි වීම මිනිසාට තර්ජනයක් නොව රටේ දියුණුවට මග පාදන අනගිතම "සම්පතක්" බවට පත් කරගත හැකි ය. මේ පිළිබඳ ව රටේ බලධාරීන් පරිසරවේදීන් හා මහජනතාවගේ අවධානය යොමු වීම අත්‍යවශ්‍ය ය.*

3 ප්‍රශ්නය

අපේක්ෂණය :

දෙන ලද ඡේදයක් සංක්ෂේප කොට ලියා දැක්වීම මෙහි දී අපේක්ෂා කෙරේ. අයදුම්කරුවන්ගේ සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා මෙන් ම භාෂා භාවිතය පිළිබඳ දැනුම ද මෙහි දී පරීක්ෂා කෙරේ. විස්තර වර්ණනා බැහැර කරමින් එහි හරය වටහා ගෙන ඒ ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී ඇගයේ.

අයදුම්කරුවන් තුළ සාරාංශකරණය පිළිබඳ මනා පළපුරුද්දක් තිබිය යුතු ය. ඒ සඳහා නිරන්තර අභ්‍යාසවල යෙදීම අනිවාර්ය වේ. මේ සඳහා අපේක්ෂිත සාරාංශය පිළිබඳ පැහැදිලි අදහසක් ලබා දී තිබේ.

**3.** පහත දැක්වෙන පාඨය වචන **55 - 65** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

රටක උන්නතියෙහි පදනම ඉහළ සාක්ෂරතාවයි. දේශගුණික විපර්යාස හා ඉන් මිහිතලයට එල්ල වන පෙර නොවූ විරූ පාරිසරික තර්ජන පිළිබඳව ගෝලීය ප්‍රජාවගේ දැනුවත්භාවය වඩාත් හොඳින් ඉහළ නැංවීම, ඒවා අවම කර ගැනීමට මහෝපකාරී වේ. පරිසරය ආරක්ෂා කිරීම පිළිබඳ අවධානය හා ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ධෛර්යවත් කිරීම සඳහා සියලු ලෝකවාසී ප්‍රජාව දැනුමින් සවිබල ගැන්වීම කාලීන අවශ්‍යතාවකි.

ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම නිසා සිදුවන දේශගුණ විපර්යාස මිනිසාගේ පැවැත්මට ඇති ප්‍රධාන අභියෝගය ලෙස මේ වන විට හඳුනාගෙන තිබේ. ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම මානව ක්‍රියාකාරකම් හේතුවෙන් වායුගෝලයට එකතු වන හරිතාගාර වායුවල ප්‍රතිඵලයක් වේ.

දේශගුණ විපර්යාස යනු මිනිසාගේ ක්‍රියාකාරකම් හේතුවෙන් වායුගෝලයේ ඇති වායු සංයුතියෙහි වෙනස් වීම නිසා දේශගුණයේ ඇති වන නොයෙකුත් වෙනස් වීම් ලෙස සරලව හඳුන්වා දිය හැකි ය. දේශගුණ ක්‍රියාවලිය සංකීර්ණ, එකිනෙක සමග අන්තර් ක්‍රියා කරන, එකිනෙක සමග සම්බන්ධතාවක් ඇති, වායුගෝලය, ගොඩබිම, අයිස් හා හිම, සාගර හා අනෙකුත් ජල පද්ධතිවලින් සමන්විත වූවක් වන අතර එම දේශගුණ පද්ධති සඳහා අවශ්‍ය ශක්තිය සූර්ය විකිරණ මගින් ලබා දේ. ෆොසිල ඉන්ධන දහනය වැඩි වශයෙන් සිදුවීම දේශගුණ විපර්යාසවලට ප්‍රධාන හේතුව වී ඇත. එම නිසා නිශ්චිතව ම වර්තමාන සහ අනාගත පරපුරට දේශගුණ විපර්යාසවලට මුහුණ දෙමින් ජීවත් වීමට සිදු වන බව දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය තහවුරු කර ඇත. නිවර්තන කලාපයට අයත් සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාව දේශගුණ විපර්යාසවලට හේතු වන ක්‍රියාකාරකම් සඳහා ඉතා ම අඩුවෙන් දායක වුවත්, දේශගුණ විපර්යාස නිසා ඇති වන අහිතකර බලපෑම්වලට මුහුණ දීමට සිදුව ඇති රටකි.

(ලකුණු 10 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

- සාරාංශකරණය

  අන්තර්ගතය

  (i) රටක උන්නතියෙහි පදනම ඉහළ සාක්ෂරතා ව යි.

  (ii) ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම මානව ක්‍රියාකාරකම් නිසා සිදු වන්නකි.

  (iii) දේශගුණික විපර්යාස නිසා මිහිතලයට පාරිසරික තර්ජන එල්ල වන අතර දේශගුණික විපර්යාස නිසා වන අහිතකර බලපෑමට ශ්‍රී ලංකාවට ද මුහුණ දීමට සිදු වේ..

  (iv) ගෝලීය ප්‍රජාවගේ දැනුවත් වීම ඉහළ නැංවීම කාලීන අවශ්‍යතාවකි.

  (v) දේශගුණික පද්ධති සඳහා අවශ්‍ය ශක්තිය සූර්ය කිරණයෙන් ලැබේ.

  (vi) දේශගුණ විපර්යාසවලට ප්‍රධාන හේතුව පොසිල ඉන්ධන දහනය යි.

| | | |
|---|---|---|
| ලකුණු විග්‍රහය | - | මුළු ලකුණු 10 යි. |
| අන්තර්ගතය | - | ප්‍රධාන අදහස් සඳහා ලකුණු 06 යි. |
| වචන ගණන | - | ලකුණු 02 යි. (වචන 50 - 60 අතර තිබීම සෑහේ.) |
| ශිල්පීය දක්ෂතා | - | ලකුණු 02 යි. (වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ ආදිය) |


අපේක්ෂිත ප්‍රධාන අදහස් :

- පෙරදිග සංස්කෘතියේ හරය අපරදිගට හඳුන්වා දුන් විද්වත්තු කිහිපදෙනෙකි
- ඔවුන්ගේ නිර්මාණ ශක්තිය, මානව දයාව හා දැනුම් සම්භාරය තවමත් බැබළෙමින් පවතී
- සංස්කෘත භාෂාව, සංගීතය, කලාව, බෞද්ධ දර්ශනය හා සංස්කෘතිය එවැනි අංශ කිහිපයකි.
- මෙරට සංස්කෘතිය ලෝකයට හඳුන්වා දුන් ආනන්ද කුමාරස්වාමි සුවිශේෂ විද්වතෙකි.
- ඔහු විසින් රචිත ''මධ්‍යකාලීන සිංහල කලා'' විශිෂ්ට සාහිත්‍ය කෘතියකි
- ඔහුගේ ලේඛන දේශීය ගෘහ නිර්මාණ ශිල්පයේ අනන්‍යතාව විදහා දැක්වීමට සමත් විය.

වචන ගණන 65 ඉක්මවන කල්හි සැලකිය යුත්තේ මුල් වචන 60 තුළ ඇති ප්‍රධාන අදහස් පමණි. වචන ගණන 45 ට අඩුවන කල්හි එහි ඇතුළත් අදහස් ගණනය කොට ඊට සුදුසු අනුපාතික ලකුණක් පිරිනමන්න. උත්තරය ඡේදයක් සේ ලියා තිබිය යුතුය. කොටුවක් තුළ පද බෙදා තිබුණ ද පිළිගන්න. එක යට එක අසම්බන්ධිත වාක්‍ය වශයෙන් ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02 කි. වචන ගණනයේ දී ලිහිල් පිළිවෙතක් අනුගමනය කරන්න. වචන ගණන දළ වශයෙන් 65 ට වැඩි වන කල්හි හෝ 45 ට අඩු වන කල්හි වචන ගණන සඳහා ලකුණු 01 හෝ 02 හෝ පිරිනමන්න.

**3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා**

**ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 96%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 2%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 16%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 40%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 42%ක් ද,

ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා හිමි ලකුණු 10න් අඩකට වැඩියෙන් එනම් ලකුණු 6ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හිමි කර ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 82%කි. ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇත්තේ අපේක්ෂකයන්ගේ 18%ක් පමණි.

අනිවාර්ය ප්‍රශ්නයක් වූ සාරාංශකරණය සඳහා ඉදිරිපත් වන ශිෂ්‍ය ප්‍රමාණය ඉහළ මට්ටමක පවතින අතර ඔවුන්ගෙන් 82%ක බහුතරයක් ප්‍රදානය කෙරෙන ලකුණුවලින් අඩකට වැඩියෙන් ලබා ගැනීමට සමත් වී ඇත. ඒ අනුව ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 68% තෙක් වර්ධනය වී ඇත.

අයදුම්කරුවන් තුළ සාරාංශකරණය පිළිබඳ මනා පුහුණුවක් තිබිය යුතු ය. ඒ සඳහා නිරන්තර අභ්‍යාසවල යෙදීම අනිවාර්ය වේ. අපේක්ෂිත සාරාංශකරණය සඳහා ආකෘතියක් පහත දැක්වේ.

**සාරාංශකරණය**

රටක උන්නතියෙහි පදනම ඉහළ සාක්ෂරතාව නිසා පරිසරය ආරක්ෂා කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ සියලු ලෝකවාසීන් දැනුවත් වීම කාලීන අවශ්‍යතාවකි. මානව ක්‍රියාකාරකම් නිසා ඉහළ යන ගෝලීය උෂ්ණත්වය මිනිසාගේ පැවැත්මට ප්‍රධාන අභියෝගයකි. වායුගෝලයේ සංයුතියෙහි ඇතිවන වෙනස්කම් නිසා සිදුවන දේශගුණික විපර්යාසවලට ශ්‍රී ලංකාවට ද මුහුණ දීමට සිදු වී ඇත. දේශගුණික පද්ධති සඳහා අවශ්‍ය ශක්තිය සූර්ය කිරණින් ලැබෙන අතර දේශගුණික විපර්යාසවලට ප්‍රධාන හේතුව ෆොසිල ඉන්ධන දහනයයි. (වචන 60)

**04 ප්‍රශ්නය**

අපේක්ෂණය : අපේක්ෂකයින්ගේ භාෂා ඥානය හා අවබෝධය පරීක්ෂා කෙරෙන්නකි. මේ සඳහා නිර්දිෂ්ට ඡේදයක් ඇසුරෙන් ප්‍රශ්න 5ක් ඉදිරිපත් කෙරේ. මේ ප්‍රශ්න මනාව අවබෝධ කරගෙන නිශ්චිත ව නිවැරදි පිළිතුරු ලිවීම අපේක්ෂා කෙරේ.

**4.** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

ලෝකයේ බොහෝ රටවල් හා සැසඳීමේ දී අප රටෙහි විදුලි ඒකකයක මිල අධික අගයකි. එබැවින් ආයෝජකයෝ ආයෝජනයට මැළිකමක් දක්වති. ශ්‍රී ලංකාවේ දෛනික විදුලිබල පරිභෝජනය 2000 MW පමණ වේ. වසරේ වැඩි කාලයක දී එයින් වැඩි ප්‍රතිශතයක් නිපදවනුයේ තාප බලාගාර මගිනි. ගල් අඟුරු, තෙල් යන කුමන ආකාරයෙන් ක්‍රියා කළ ද ඉදිරි වසර කීපය තුළ දී මිල ඉහළ යෑම, තෙල් නිධි අවසන් වීම යන කරුණු නිසා එම බලාගාර මත පැවැත්ම රටට විශාල අවදානමකි.

ශ්‍රී ලංකාව කුඩා රටක් වුව ද ජනගහනය ඉතා ඉහළ නිසා බලාගාර ආකෘතියෙන් බලශක්ති අර්බුදයට එක් හොඳ විසඳුමක් විය හැක්කේ න්‍යෂ්ටික බලාගාරයි. එහෙත් න්‍යෂ්ටික බලාගාරයක් අත් කර ගැනීමට අප රටෙහි ජනතාවගේ සහ පාලකයන්ගේ අවබෝධය, ආකල්ප, කැපවීම සහ ශක්තිය තවමත් ප්‍රමාණවත් තැනක නැත. එම නිසා වෙනත් විකල්ප කෙරෙහි යොමු වීම ඉතා වැදගත් වේ.

වසරකට පෘථිවියට ලැබෙන සූර්ය ශක්තිය 173000 TW පමණ වේ. එය මානව අවශ්‍යතාව මෙන් 10000 ගුණයකි. එම නිසා පරිසර සාධක වැනි සියලු කරුණු සැලකිල්ලට ගත් විට මුළු ලෝකය ම යොමු විය යුතු ප්‍රධානතම බලශක්ති ප්‍රභවය විය යුත්තේ සූර්ය ශක්තියයි. සූර්ය පැනල ව්‍යාපෘති මගින් ද අනාගතයේ විශාල පාරිසරික ගැටලු මතුවනු ඇත. මන්ද මේවා ඉවත් කරන විට එය විසල් ගැටලුවකට මග පාදන බැවිනි. එම නිසා දැනටමත් සූර්ය පැනල සවිකරන හා ඒවා මෙරටට ගෙන්වන ආයතන ඒවා නැවත බැහැර කරන ආකාරය පිළිබඳව පැහැදිලි කළ යුතු ය. එමෙන්ම ඇතැම් සූර්ය කෝෂ විෂ සහිත සංයෝග මගින් නිපදවෙන නිසා ඒවා ලංකාවට ගෙන ඒමේ දී රජය ඉතා සැලකිලිමත් විය යුතු ය.

(i) ආයෝජකයින් ශ්‍රී ලංකාවේ ආයෝජනයට පසුබට වන්නේ කුමන කරුණක් නිසා ද?
(ii) තාප බලාගාර මත පැවැත්ම රටට විශාල අවදානමක් වන්නේ කවර හේතු නිසා ද?
(iii) ශ්‍රී ලංකාවට න්‍යෂ්ටික බලාගාරයක් අත්කර ගැනීමට බාධා පමුණුවන කරුණු මොනවා ද?
(iv) මුළු ලෝකයේ ම අවධානය යොමු විය යුතු ප්‍රධාන බලශක්ති ප්‍රභවය වශයෙන් ලේඛකයා හඳුන්වන්නේ කුමක් ද?
(v) සූර්ය පැනල මෙරටට ගෙන්වීමේ දී රජය සැලකිලිමත් විය යුත්තේ ඇයි?

(ලකුණු 10 යි)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) විදුලි ඒකකයක මිල අධික අගයක් ගැනීම නිසා

(ii) ගල් අඟුරු, තෙල් යන කුමන ආකාරයෙන් ක්‍රියාකළ ද ඉදිරි වසර කිහිපය තුළ දී මිල ඉහළ යාම හා තෙල් නිධි අවසන් වීම නිසා

**(එක් කරුණකට ලකුණු 01 යි)**


(iii) අප රටේ ජනතාවගේ සහ පාලකයන්ගේ අවබෝධය, ආකල්ප, කැපවීම සහ ශක්තිය තවමත් ප්‍රමාණවත් තැනක නො තිබීම
(තවමත් යනුවෙන් නොතිබුණ ද ලකුණු දෙන්න.)

(iv) සූර්ය ශක්තිය


(v) මේවා ඉවත් කරන විට විශාල ගැටලුවලට මඟ පෑදීම
අනාගතයේ විශාල පාරිසරික ගැටලු ඇති වීම
ඇතැම් සූර්ය කෝෂ විෂ සහිත සංයෝග මගින් නිපදවා තිබීම

**(කරුණු 2 ක් ඇත්නම් ලකුණු 02 යි. එක් කරුණක් සඳහා ලකුණු 01 යි)**

**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා**




ප්‍රශ්න අංක 04ට පිළිතුරු සපයා ඇති පිරිස 95%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 2%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 5%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 13%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 80%ක් ද,
ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 06ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් පිරිස 93%ක් වන අතර, 07%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 05ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් 5 අතුරෙන් පිළිතුරු සැපයීම වඩාත් සාර්ථක වී ඇත්තේ (iv) කොටස සඳහා ය. එහි පහසුතාව 92% කි. (i), (ii), (iii), (v) කොටස්වල පහසුතාව පිළිවෙළින් 91%, 88%, 91% සහ 58%කි. (v) කොටසෙහි පහසුතාව අඩු මට්ටමක පවතින අතර (i), (ii), (iii), (iv) කොටස්වල පහසුතාව ප්‍රශස්ත මට්ටමක පවතී.

ඉදිරිපත් කර ඇති ඡේදය ඇසුරෙන් අපේක්ෂකයන්ගේ අවබෝධය මැනීම තවදුරටත් සංවර්ධනය කිරීමට බාහිර පොත පත, මුද්‍රිත සඟරා ආදිය පරිශීලනය සඳහා සිසුන් උනන්දු කරවීම ගුරුභවතුන්ගේ කාර්යයකි. දුරවබෝධ වචනවල අර්ථාවබෝධයට ද සිසුන් යොමු කළ යුතු වෙයි. එහිලා පන්ති කාමරය තුළ අර්ථාවබෝධ අභ්‍යාස හුරු කිරීම ද කළ යුතු ය.

දෙන ලද පාඨය කියවා අසන ලද ප්‍රශ්නයට නිශ්චිත පිළිතුරු තෝරා ගැනීමේ හැකියාව ඇතැම් අපේක්ෂකයන්ට නොතිබුණු බව පැහැදිලි වන බැවින් අදාළ පිළිතුරු සෘජුව තෝරා ගෙන නිශ්චිත ව ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් යොමු කළ යුතුව ඇත.

මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීම වඩාත් සාර්ථක මට්ටමක පැවති බව පෙනේ. අවබෝධය පිළිබඳ ව විමසා තිබූ ප්‍රශ්න පහෙන් හතරක පහසුතාව 85% ඉක්මවා තිබිණි. ඒ අනුව මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 84%ක පමණ ඉහළ අගයක් ගන්නා අතර II පත්‍රයෙහි ප්‍රශ්න පහ අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්නය බවට මෙම ප්‍රශ්නය පත්ව ඇත.

5 ප්‍රශ්නය

අපේක්ෂණය : මෙහි එක් ප්‍රශ්නයක් වන්නේ රාජකාරි ලිපියක් ලිවීමයි. එහි ම අනෙක් ප්‍රශ්නය වනුයේ පුවත්පත් වාර්තාවක් සකස් කිරීමයි. මෙබඳු ප්‍රශ්න මගින් නූතන සමාජයෙහි විවිධ ප්‍රායෝගික ලේඛන පිළිබඳ අධ්‍යයනය හා ඒවා සිත් ගන්නා පරිදි නිර්මාණාත්මකව ලියා දැක්වීමත් පිළිබඳ අපේක්ෂකයින්ගේ කුසලතාව විමර්ශනය කෙරේ.

**5.** පහත දැක්වෙන විස්තරය පදනම් කොටගෙන අත් පත්‍රිකාවක් සකස් කරන්න. මේ සඳහා වචන **100**ක් පමණ යොදා ගැනීම ප්‍රමාණවත් ය.

ආහාර පරිභෝජනයේ දී භාවිතයට ගැනෙන පොලිතීන් හා ප්ලාස්ටික් අසුරනවලට විකල්පයක් වශයෙන් කෙසෙල් කොළ භාවිතයෙන් ආහාර ඇසුරුම් සකස් කිරීම සඳහා පුහුණු කිරීමේ වැඩමුළුවක් හෙට්ටිගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සංවර්ධන ඒකකය මගින් සංවිධානය කොට ඇත. ස්ත්‍රී-පුරුෂ හා වයස් භේදයකින් තොරව ඕනෑම අයෙකුට මෙම වැඩමුළුවට සහභාගි විය හැකි අතර අදාළ පුහුණුව ලැබීමෙන් අනතුරුව නව නිෂ්පාදන හඳුන්වා දෙන පුද්ගලයන්ට ඒවා වැඩිදියුණු කරගැනීම සඳහා බැංකු ණය පහසුකම් ප්‍රදානය කිරීම මෙන් ම අලෙවි කර ගැනීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ද සිදු කෙරේ. ප්‍රජා සංවර්ධන ඒකකයේ ලේකම් මාධව අතපත්තු ඔබ යැයි උපකල්පනය කරන්න.

**නැතහොත්**

ඔබ විසින් අලුතින් ආරම්භ කරන ලද මුද්‍රණ ආයතනයේ සේවාවන් පිළිබඳ සඳහන් කරමින් පුවත්පතක පළ කිරීම සඳහා සුදුසු ආකර්ෂණීය වෙළෙඳ දැන්වීමක් සකස් කරන්න. පහසු මිල ගණන්, ගුණාත්මක සහ කලාත්මක භාවයෙන් යුක්ත කඩිනම් සේවාව, වාරික වශයෙන් මුදල් ගෙවීමේ හැකියාව යන කරුණු අවධාරණය විය යුතු ය.

(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

(ලකුණු 15 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

**අත් පත්‍රිකාව**

| | | |
|---|---|---|
| 1. | ආකෘතිය | ලකුණු 5යි |
| 2. | අන්තර්ගතය | ලකුණු 7යි |
| 3. | ශිල්පීය දක්ෂතා | ලකුණු 3යි |
| | මුළු ලකුණු | ලකුණු 15යි |

1. **ආකෘතිය** - ලකුණු 05යි.
   1. ශීර්ෂ පාඨය / මාතෘකාව ලකුණු 1යි.
   2. පළ කරන්නාගේ නම, තනතුර ලකුණු 1යි.
   3. පළ කරන දිනය ලකුණු 1යි.
   4. නි මාණාත්මක බව ලකුණු 2යි.

2. **අන්තර්ගතය** - ලකුණු 07යි.
   1. පොලිතීන් හා ප්ලාස්ටික් අසුරනවලට විකල්පයක් වශයෙන් කෙසෙල් කොළ භාවිතයෙන් ආහාර ඇසුරුම් සකස් කිරීම
   2. එම ඇසුරුම් සකස් කිරීමේ වැඩමුළුව හෙට්ටිගොඩ ප්‍රාදේශීය සභාවේ දී පැවැත්වීම
   3. දිනය සහ වේලාව
   4. සංවිධානය: ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සංවර්ධන ඒකකය
   5. ස්ත්‍රී පුරුෂ වයස් භේදයකින් තොරව සහභාගි වීමේ හැකියාව
   6. පුහුණුව ලැබීමෙන් පසු නව නිෂ්පාදන හඳුන්වා දෙන අයට බැංකු ණය පහසුකම් සැලසීම
   7. එම නිෂ්පාදන අලෙවි කර ගැනීමට වෙළෙඳපොළ සකස් කිරීමේ ප්‍රවර්ධන වැඩසටහන්

3. **ශිල්පීය දක්ෂතා** ලකුණු 03යි.

නැතහොත්

වෙළෙඳ දැන්වීම

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15යි.

| | | |
|---|---|---|
| 1. | ආකෘතිය සඳහා | ලකුණු 05යි. |
| 2. | අන්තර්ගතය සඳහා | ලකුණු 07යි. |
| 3. | ශිල්පීය දක්ෂතා සඳහා | ලකුණු 03යි. |

1. **ආකෘතිය ලකුණු 05යි.**

| | |
|---|---|
| 1. මාතෘකාව | ලකුණු 01යි. |
| 2. පළ කරන්නාගේ නම, තනතුර | ලකුණු 01යි. |
| 3. පළ කරන දිනය | ලකුණු 01යි. |
| 4. නිර්මාණාත්මක බව | ලකුණු 02යි. |

2. **අන්තර්ගතය සඳහා ලකුණු 07යි.**


| | |
|---|---|
| 1. මුද්‍රණ ආයතනයේ නම | ලකුණු 01යි. |
| 2. මුද්‍රණ ආයතනයේ සේවාවන් | ලකුණු 01යි. |
| 3. මිල ගණන් | ලකුණු 01යි. |
| 4. ගුණාත්මක භාවය | ලකුණු 01යි. |
| 5. කලාත්මක භාවය | ලකුණු 01යි. |
| 6. කඩිනම් සේවාව | ලකුණු 01යි. |
| 7. වාරික වශයෙන් මුදල් ගෙවීමේ හැකියාව | ලකුණු 01යි. |

3. **ශිල්පීය දක්ෂතා ලකුණු 03යි.**

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.


* නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නො වන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.
* නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්ත□ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03කි.

### 5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා




5 ප්‍රශ්නය පිළිතුරු සපයා ඇති අපේක්ෂකයින් සංඛ්‍යාව 92%කි. ලකුණු 15ක් හිමිවන මෙම ප්‍රශ්නය සඳහා
ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 5%ක් ද,
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 13%ක් ද,
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 44%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 38%ක් ද,
ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 04ට අඩුවෙන් ලබා ගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 05%ක් පමණි. 82%ක ප්‍රතිශතයක් ප්‍රශ්නයට හිමි ලකුණින් අඩකට වඩා ලබාගෙන තිබිණ.

මෙම ප්‍රශ්නය යටතේ ප්‍රශ්න දෙකක් ඇතුළත් ය. අපේක්ෂකයාට පහසු ප්‍රශ්නය තෝරා ගෙන පිළිතුරු ලිවීමේ අවස්ථාව ලබා දී ඇත.




5 ප්‍රශ්නයේ (අ) කොටස සඳහා අපේක්ෂකයින්ගේ පහසුතාව 66%ක් ද, (ආ) කොටසෙහි පහසුතාව 50%ක් ද වේ. මේ අනුව මෙම ප්‍රශ්නයේ (අ) කොටස පහසුතාව වැඩි කොටස ලෙස දැක්විය හැකි ය.

ප්‍රායෝගික ලේඛන යටතේ සැකසුණු අත් පත්‍රිකාවේ ආකෘතිය සඳහා ලකුණු 05ක් ද අන්තර්ගතය සඳහා ලකුණු 07ක් ද ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03ක් ද වෙන් කර ඇත.

වෙළෙඳ දැන්වීමෙහි ආකෘතියට ලකුණු 5ක් ද, අන්තර්ගතයට ලකුණු 7ක් ද, ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 3ක් ද වෙන් කර ඇත.

මෙහි දී අන්තර්ගතයට වෙන් කර ඇති ප්‍රධාන කරුණු හඳුනා ගැනීමට සිසුන් හුරු කළ යුතු ය. එසේ වූ කල්හි අන්තර්ගතයට වෙන් කර ඇති මුළු ලකුණු අපේක්ෂකයන්ට හිමි කර ගැනීමට පහසු වේ.

මෙම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම තරමක් සතුටුදායක ය. නියමිත ප්‍රායෝගික ලේඛන ආකෘතියකට අනුව ලිවීම හුරු කළ යුතු ය. මෙබඳු ප්‍රශ්න සඳහා සතුටුදායක පිළිතුරු ලිවීමට නිරවුල් අවබෝධයක් ලබා ගැනීම පිණිස ආදර්ශ ලිපියක ආකෘතියක් පහත දක්වා ඇත.

විවිධ අත් පත්‍රිකාවල ආකෘති පිළිබඳ ව අපේක්ෂකයන් දැනුවත් කොට ඒ පිළිබඳ ව අභ්‍යාසවල යෙදවීම සුදුසු ය.

ආදර්ශ අත්පත්‍රිකාව

"හිතකර පරිසරයක් - දිවියට අත්වැලක්"

පොලිතින් හා ප්ලාස්ටික් ආහාර අසුරනවලට විකල්ප වශයෙන් කෙසෙල් කොළ භාවිතය ඉතා වැදගත් කරුණකි. කෙසෙල් කොළ භාවිතයෙන් ආහාර ඇසුරුම් සකස් කිරීම පිළිබඳ පුහුණු කිරීමේ වැඩමුළුවක් ප්‍රාදේශීය ප්‍රජා සංවර්ධන ඒකකය මගින් සංවිධානය කර ඇත.

දිනය - 2017.12.01 පෙ.ව. 8.30
ස්ථානය - හෙට්ටිගොඩ ප්‍රාදේශීය සභා ශාලාව

මෙම වැඩමුළුවට අවුරුදු 18ට වැඩි ස්ත්‍රී, පුරුෂ ඕනෑ ම කෙනෙකුට සහභාගි විය හැකි ය. පුහුණුව ලැබීමෙන් පසු නව නිෂ්පාදන හඳුන්වා දෙන අයට බැංකු ණය පහසුකම් සැලසීමත්, නිෂ්පාදන අලෙවිය සඳහා වෙළඳ පොළ පහසුකම් සැලසීමත් සිදු කෙරේ. මේ අනගි අවස්ථාවට ප්‍රදේශවාසී ඔබ සැමගේ පැමිණීම ගෞරවයෙන් අපේක්ෂා කරමි.

මාධව අතපත්තු
ලේකම්
ප්‍රජා සංවර්ධන ඒකකය,
හෙට්ටිගොඩ ප්‍රාදේශීය සභාව.

2017.11.20

## 2.3 III ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.3.1 **III** ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**මුළු ලකුණු** 80කි.

කාලය පැය 02යි.

සිංහල භාෂාව හා සාහිත්‍යය III ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 7කින් සමන්විත ය.
මෙහි 1, 2, 3, 4 ප්‍රශ්න අනිවාර්ය වේ.

**පළමු ප්‍රශ්නය** සඳහා කොටස් දහයක් ඇතුළත් වේ. කොටසක, එක් අනුකොටසකට ලකුණු 1 බැගින් මුළු ලකුණු 20කි.

**දෙවන ප්‍රශ්නය** කොටස් පහකින් සමන්විතය. එක් කොටසකට ලකුණු 4 බැගින් ලකුණු 20කි.


3,4 ප්‍රශ්න සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් වෙන් කර ඇත. මෙහි දී "නැතහොත්" යන්නෙන් අපේක්ෂකයාට විකල්ප ප්‍රශ්නයක් තෝරා ගැනීමට අවස්ථාව ලබා දී ඇත.

5, 6, 7 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 10ක් වෙන් කර ඇත.

III පත්‍රය සඳහා මුළු ලකුණු = 80

### 2.3.2 III ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

III පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, ප්‍රස්තාර 5, 6 හා 7 ඇසුරෙන් සකස් කර ඇත. එක් එක් ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර, ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.




(RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

**පළමු ප්‍රශ්නය** මගින් නිර්දිෂ්ට සාහිත්‍ය සංග්‍රහයේ එන සාහිත්‍යමය පාඩම් ඇසුරෙන් කෙටි පිළිතුරු සැපයිය හැකි කොටස් ප්‍රශ්න දහයක් විමසනු ලැබේ. එම කොටස් දහය ද (අ) - (ආ) ලෙස අනුකොටස් දෙකකට ද බෙදනු ලැබේ. ඒ එක් කොටසකට හිමි වන්නේ ලකුණු එක බැගිනි. ඒ අනුව කොටස් විස්ස සඳහා ලකුණු 20ක් හිමි වේ. පළමු ප්‍රශ්නයෙහි පහසුතාව 62%කි.

**දෙවන ප්‍රශ්නය** යොමු වන්නේ නිර්දිෂ්ට ග්‍රන්ථවල ගද්‍ය - පද්‍ය පාඨ ඇසුරෙන් අයදුම්කරුවන් සතු සාහිත්‍යමය දැනුම පරීක්ෂා කිරීමට ය. මෙහි දී නිර්දිෂ්ට පාඨ පහක් ලබා දෙන අතර ඒ ඒ පාඨය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය. මේ සඳහා එක් කොටසකට ලකුණු 4 බැගින් ලකුණු 20ක් හිමි වේ. දෙවන ප්‍රශ්නය සඳහා පහසුතාව 49%කි.

3-4 ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයන්ගේ විශ්ලේෂණාත්මක දැනුම ඇගයීම මූලික අපේක්ෂාව ය. මෙහි දී "නැතහොත්" යන්නෙන් අපේක්ෂකයන්ට විකල්ප ප්‍රශ්නයක් තෝරා ගැනීමට ද හැකියාව ඇත. මේ සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් හිමි වේ.

**3 වන ප්‍රශ්නය** කොටස් 2කින් සමන්විත වූ අතර එහි මුල් ප්‍රශ්නය සඳහා පහසුතාව 52%ක් ලබා ගෙන ඇත. මෙහි නැතහොත් යනුවෙන් දක්වා ඇති ප්‍රශ්නයේ පහසුතාව 59%කි.

**4 වන ප්‍රශ්නය** ද කොටස් දෙකකින් යුක්ත වන අතර එහි පළමු ප්‍රශ්නයේ පහසුතාව 39%කි. මෙහි නැතහොත් යනුවෙන් දක්වා ඇති ප්‍රශ්නයේ පහසුතාව 59%කි.

සිංහල භාෂාව හා සාහිත්‍යය III පත්‍රයේ 1, 2, 3, 4 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර 5, 6, 7 ප්‍රශ්නවලින් අපේක්ෂකයින්ගේ පිළිතුරු සැපයිය යුත්තේ එක් ප්‍රශ්නයකට පමණි. මෙහි අභිමතාර්ථය වනුයේ නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රිත ව අපේක්ෂකයින් තුළ පවත්නා විශ්ලේෂණාත්මක, විචාරාත්මක, තර්කානුකූල දැනුම හා රසඥතාව මැන බැලීමයි. මේ සඳහා ලකුණු 10ක් වෙන් කර ඇත. මෙහි දී 71%ක වැඩි ම පහසුතාව 7 වන ප්‍රශ්නයට ලැබී ඇත. අඩු ම පහසුතාව 46%ක් වූ අතර එය 5 වන ප්‍රශ්නය සඳහා ලබාගෙන තිබුණි.

01. ප්‍රශ්නය

අපේක්ෂණය : නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ව්‍යූහය හා ලකුණු විග්‍රහය : මුළු ලකුණු 20යි.
මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුරු අපේක්ෂිත අනුකොටස් දෙක බැගින් යුත් කෙටි ප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුකොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20 කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) (අ) 'ගුත්තිල කාව්‍යය' රචනා කරන ලද්දේ කවර සාහිත්‍ය යුගයේ ද?
(ආ) 'ගුත්තිල කාව්‍යයේ' රචකයා නම් කරන්න.

(ii) (අ) සිංහල ජන ජීවිතය පිළිබඳ ඉංග්‍රීසි භාෂාවෙන් රචිත 'විලේජ් ඉන් ද ජංගල්' කෘතියේ කතුවරයා නම් කරන්න.
(ආ) 'බැද්දේගම' හැර ඒ. පී. ගුණරත්න මහතා විසින් පරිවර්තනය කරන ලද වෙනත් නවකතාවක් නම් කරන්න.

(iii) (අ) 'ගංගාවේ සංගීතය' පැදිපෙළ අයත් වන්නේ කවර යුගයකට ද?
(ආ) 'කුණාටුව', 'එකෝමත් එක රටක', 'සංවාදය' යන කාව්‍ය ග්‍රන්ථවල රචකයා කවරෙක් ද?

(iv) (අ) 'පන්සිය පනස් ජාතක පොත' සඳහා මූලාශ්‍රය කොටගත් ග්‍රන්ථය නම් කරන්න.
(ආ) මහෞෂධ පඬිතුමාගේ බුද්ධි මහිමය ප්‍රකාශ කිරීම සඳහා රචනා කරන ලද ජාතක කථාව කුමක් ද?

(v) (අ) 'සිංහබාහු' නාට්‍යය හැර මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා විසින් රචිත වෙනත් නාට්‍ය **දෙකක්** ලියන්න.
(ආ) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ ස්වයං ලිඛිත චරිතාපදානය කවර නමකින් හැඳින්වේ ද?

(vi) (අ) 'හංස සන්දේශය', 'ලෝවැඩ සඟරාව', 'කව් ලකුණු මිණිමල' යන ග්‍රන්ථවල කතුවරයා නම් කරන්න.
(ආ) 'හංස සන්දේශය' ලියන ලද සාහිත්‍ය යුගය දක්වන්න.

(vii) (අ) කේ. ජයතිලක මහතා විසින් රචනා කරන ලද කෙටිකතා සංග්‍රහ **දෙකක** නම් ලියන්න.
(ආ) 'දියමන්ති මාලය' කෙටිකතාවේ ප්‍රධාන චරිතය කුමක් ද?

(viii) (අ) දැනට මෙරට හමු වී ඇති පැරණිතම සිංහල කෘතිය කුමක් ද?
(ආ) එම කෘතියේ රචකයා නම් කරන්න.

(ix) පහත සඳහන් කවියේ ඉතිරි පද **දෙක** සම්පූර්ණ කරන්න.
සිය පින් සිරින් සරු
දෙතිස් ලකුණෙන් විසිතුරු
(අ) ..........................................
(ආ) ..........................................

(x) (අ) 'කව්මිණ', 'කව්මුතු', 'ළමා කව් කලඹ' යන කෘතිවල රචකයා නම් කරන්න.
(ආ) සිනිඳු මොළොක් බව මලෙහී
පිරිසිදු බව පිනි බිඳෙහී
යන පද්‍යය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය සඳහන් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

1. (i) (අ) කෝට්ටේ යුගය
(ආ) වැත්තෑවේ හිමි

(ii) (අ) ලෙනාඩ් වුල්ෆ් / වුල්ෆ්
(ආ) සුදු ගෝනා, වානරයා, වන සරණ, මැකී ගිය දඬමං, වාලම්පුරි

(iii) (අ) කොළඹ යුගය
(ආ) එච්.එම්. කුඩලිගම / කුඩලිගම කවියා

(iv) (අ) පාලි ජාතකට්ඨ කථාව / ජාතකට්ඨ කථාව
(ආ) උම්මග්ග ජාතකය / උමංදාව

(v) (අ) මනමේ, වෙස්සන්තර, මහාසාර, පබාවතී, පෙමතො ජායති සොකො, රත්තරන්, එලොව ගිහින් මෙලොව ආවා, ලෝමහංස, කදා වළලු, කිරි මුට්ටිය ගඟේ ගියා, බව කඩතුරාව.
(ආ) පින් ඇති සරසවි වරමක් දෙන්නේ.

(vi) (අ) වීදාගම මෛත්‍රෙය හිමි / මෛත්‍රෙය හිමි / වීදාගම මාහිමි / වීදාගම හිමි /මෛත්‍රෙය මාහිමි
(ආ) කෝට්ටේ යුගය


(vii) (අ) අතීරණය, කටු සහ මල්, එක ගෙයි අවුරුද්ද, වජිර පබ්බත, පුනරුත්පත්තිය හා තවත් කෙටි කතා, නොනිමි සිත්තම හා තවත් කෙටිකතා, දියණිය ආපසු එයි.
(ආ) මැටිල්ඩා / ලොයිසල් මහත්මිය.

(viii) (අ) දම්පියා අටුවා ගැටපදය. (ධම්පියා අටුවා ගැටපදය)
(ආ) දෙබිස වැ ජා අබා සලමෙවන් / අබා සලමෙවන් / පස්වන කාශ්‍යප රජතුමා

(ix) කෙලෙසුන් කෙරෙන් දුරු
වඳිම් මුනි උතුමන් තිලෝගුරු

(x) (අ) ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි / මහින්ද හිමි / එස්. මහින්ද හිමි / සිකීම් මහින්ද හිමි
(ආ) ජාතික තොටිල්ල / දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල/දරු නැළවිල්ල


**1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා**




අනිවාර්ය ප්‍රශ්නයක් වූ 1 ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති පිරිස 98%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 15%ක් ද
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 21%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 37%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 27%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ට අඩුවෙන් ලබා ගත් පිරිස 36%කි.




ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 62% කි. ප්‍රශ්නයේ කොටස් 10 අතුරෙන් I කොටස (ආ) අනුකොටස සඳහා පහසුතාව 91%ක් ද (අ) කොටසට පහසුතාව 86%ක් ද වේ. II කොටස (අ) අනුකොටස සඳහා පහසුතාව 89%ක් ද (vii) (ආ) අනුකොටස සඳහා පහසුතාව 80%ක් ද වේ.

පහසුතාව අඩු ම කොටස් වන්නේ (viii) කොටසෙහි (ආ) සහ (අ) අනුකොටස් ද (v) කොටසෙහි (ආ) අනුකොටස ද (ix) කොටසෙහි (අ) අනුකොටස ද වන අතර ඒවා අනු පිළිවෙළින් 6%, 7%, 34%, 38% ද වේ.

පොදුවේ ගත් කල සෙසු ප්‍රශ්න සඳහා පහසුතාව 41% සිට 77% දක්වා ලබා ගෙන ඇති බව පෙනේ.

මෙසේ වීමට හේතු ලෙස පහත සඳහන් කරුණු ඉදිරිපත් කළ හැකි ය. (viii) කොටස (අ) සහ (ආ) අනු කොටස්වලින් දැනට මෙරට හමු වී ඇති පැරණිතම කෘතිය ද එම කෘතියේ කතුවරයා ද (v) කොටස (ආ) අනුකොටසට මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ ස්වයං ලිඛිත චරිතාපදානය හැඳින්වෙන නම ද (ix) කොටස (අ) අනුකොටසට පිළිතුරු මෙන්ම (ආ) අනුකොටසට පිළිතුරු ලෙස 'සියපින් සිරින් සරු' පද්‍යයේ 3, 4 පද්‍ය පාද ලිවීමට ද බොහෝ අපේක්ෂකයන් අපොහොසත් වී තිබීමෙන් පෙනෙන්නේ නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනයේ ඇති දුර්වලතාවයි.

## 02 ප්‍රශ්නය

**අපේක්ෂණය :** දෙවන ප්‍රශ්නය ද අනිවාර්ය ය. මෙහි දී නිර්දිෂ්ට පාඨ පිළිබඳ අවබෝධය ඇති ව පාඨය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම අපේක්ෂා කෙරිණි. මෙහි දී ලිහිල් බසින් ලිවීම, කාව්‍යාලංකාර හා අවස්ථා සම්බන්ධය දැක්වීම, දුරවබෝධ වචනවලට අරුත් සැපයීම අපේක්ෂකයා විසින් සිදුකළ යුතුව තිබිණි.

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "ඔව්, එදා ඔයාට හම්බු වෙලා කථා බස් කරලා ගිය දවසෙ ඉඳන් අද වන තුරු මම වින්ද කරදර හිරිහැර අනන්තයි. අප්‍රමාණයි. ඉතින් ඒ ඔක්කෝම මං වින්දෙ ඔයා හින්දා"
(අ) මෙය ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් කා හට ද?
(ආ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ii) "නැගී සිටුව! ආචාරිනි, මා නො වඳුව" කියා මහ බෝසතාණන් වහන්සේ බැණ නැගි හඬ සියලු චතුරංගිනී සේනායෙහි අරගල මැඬ ගෙන සිටියේ ය.
(අ) චතුරංගිනී සේනාව නම් කරන්න.
(ආ) මෙම ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iii) කුළින් කුළම සිහිල'ඹ වැහෙන කඳුරුය
දොළින් දොළම කල් යල් කරන කුඹුරුය
පළින් පළම තල් පොල් ගෙ වතු මැඳුරුය
තළින් තළම පුල් පියුමු'පුල පඬෙරුය
(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.
(ආ) මේ කවියෙන් කියැවෙන ප්‍රදේශයේ ස්වභාවය විස්තර කරන්න.

(iv) "ඔහු වියපත් කල්හි මවුපියෝ ශිල්ප උගන්නට තක්සලා නුවර නගා-යවූහ. හෙ **ධර්මාන්තෙවාසික** වැ ශිල්ප උගන්නි. **වත්සපනැ**. කී කී දැයක් වහා සපයයි. මන වඩන නියායෙන් හැසිරෙයි. පෙම් වඩන නියායෙන් බෙ ණෙයි"

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) සමස්ත පාඨයේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

(v) ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
එය රැක ගන්නට මෙ ලොවේ
සමත් වෙතොත් පුත නුඹ වේ

(අ) ඉහත සඳහන් කවියේ අන්තර්ගත රූපක දෙකක් ලියන්න.

(ආ) සමස්ත කවියේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) (අ) මැටිල්ඩා ලොයිසල් විසින් ෆොරොස්ටියර් මැතිනියට.

(ආ) එක්තරා ඉරිදා උදෑසනක මැටිල්ඩාට ෆොරොස්ටියර් මහත්මිය හමු වූ අවස්ථාවේ මැටිල්ඩා ලොයිසල් මහත්මිය විසින් ෆොරොස්ටියර් මහත්මියට කරන ලද ප්‍රකාශයකි.

(ii) (අ) ඇත්, අස්, රිය, පාබල
හස්ති, අශ්ව, රථ, පාබල

(ආ) ධර්ම යුද්ධ අවස්ථාවේ දී මැණික ලබා ගැනීමට කේවට්ට බමුණා බිමට නැමුණු විට මහෞෂධ පඬිතුමා කේවට්ට බමුණාගේ මුහුණ, බිම අතුල්ලමින් කරන ලද ප්‍රකාශයකි.

(iii) (අ) සිහිලඹ - සිහිල් ජලය / සීතල ජලය
සිසිල් දිය / සිසිල් පැන්
පඬෙර - සුදු නෙළුම්

(ආ) කඳු මුදුනක් පාසා සීතල ජලය වෑහෙන දිය පාරවල් තිබීම
යල මහ දෙකන්නය වගා කරන කුඹුරු තිබීම
තල් ගස්, පොල් ගස් සහිත ගෙවතු හා විශාල ගෙවල් තිබීම
නෙළුම්, මානෙල් මල් පිපුණු විල් තිබීම


(iv) (අ) ධර්මාන්තේවාසිකවැ - ධර්මයට අතවැසිව / ගුරුවරයා සමීපයේ ඉඳිමින් උවටැන් කරමින් ශිල්ප ඉගෙනීම / ආවතේව කරමින් ශිල්ප ඉගෙනීම
වත්සපනැ - වත් සම්පන්න / පිළිවෙතින් සම්පූර්ණව / වතාවත් සම්පූර්ණ කරමින් / වත් පිළිවෙත් සපුරමින්

(ආ) ඔහු වයසින් මුහුකුරා ගිය විට දෙමවුපියෝ ශිල්ප ඉගෙනීමට තක්සලා නුවරට යැවූහ. ඔහු ධර්මයට අතවැසි ව ශිල්ප උගනියි. පිළිවෙතින් සම්පූ ණ ය. කී කී දෙය ඉක්මනින් සපයා දෙයි. සිත් සතුටු කරන ආකාරයට හැසිරෙයි. සිත් ඇදගන්නා ආකාරයෙන් / චිත්තාකර්ෂණීය ලෙස කතා කරයි.

(v) (අ) ජාතිය රන් විමනක්
ආගම මිණි පහනක්

(ආ) ජාතිය රන් විමානයකි. ආගම මැණික් පහනකි. ආගම හා ජාතිය රැක ගැනීමට ලෝකයෙහි සමතෙක් වේ නම් පුත, ඒ නුඹ වේ.


## 2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා




අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර දෙස බැලීමේ දී මෙම ප්‍රශ්නය තෝරා ගැනීම 94%ක ප්‍රතිශතයක් ගත්ත ද නිවැරදි පිළිතුරු ඉදිරිපත් කිරීමේ දී අඩු ප්‍රතිශතයක් ගෙන ඇත. ඒ අනුව

ලකුණු 00-05 ප්‍රාන්තරයේ 26%ක් ද
ලකුණු 06-10 ප්‍රාන්තරයේ 26%ක් ද
ලකුණු 11-15 ප්‍රාන්තරයේ 28%ක් ද
ලකුණු 16-20 ප්‍රාන්තරයේ 20%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත.




ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 49%කි. ප්‍රශ්නයේ කොටස්වල පහසුතාව පිළිවෙළින්

I කොටස (අ) 55%ක් ද (ආ) 45%ක් ද
II කොටස (අ) 68%ක් ද (ආ) 55%ක් ද,
III කොටස (අ) 31%ක් ද (ආ) 54%ක් ද,
iv කොටස (අ) 15%ක් ද (ආ) 50%ක් ද,
v කොටස (අ) 43%ක් ද (ආ) 72%ක් ද

විය.

මෙහි දී iv කොටසේ (අ) සහ (iii) කොටසේ (අ) අනු කොටස්වල පහසුතාව අඩු මට්ටමක පැවතිණි. මෙම ප්‍රශ්න අනුකොටස් දෙකෙන් ම දී ඇති පද්‍ය හා ගද්‍ය පාඨවල කළුකර තිබුණු වචනවලට අර්ථ සැපයීම අපේක්ෂා කෙරිණි. පද්‍යය හංස සන්දේශයේ කැරගල වැනුමේ එන "කුළින් කුළම" පද්‍ය වූ අතර ගද්‍ය පාඨය අමාවතුරේ අඟුල් මල් දමනය පාඩමෙන් උපුටා ගත්තකි.

සමස්තයක් වශයෙන් ගත් කල ගද්‍ය, පද්‍ය. කොටස්වල දුරවබෝධ වචනවල අර්ථ පැහැදිලි කරදීමත්, අර්ථාවබෝධය වර්ධනය කරලීමට පන්ති කාමරය තුළ ශිෂ්‍යයන් යොමු කරලීමත් වැදගත් වේ. විශේෂයෙන් ම කළු අකුරින් දක්වා ඇති වචනවල පමණක් නො ව සමස්ත කොටසේ ම අර්ථ ලිවීම වැදගත් බව අපේක්ෂකයන්ට අවධාරණය කළ යුතු වේ.

සිංහල ගද්‍ය පද්‍ය පාඨවල දුරවබෝධ වචනවල තේරුම් කටපාඩම් කරවීම, නිරන්තර අභ්‍යාසවල යෙදවීම මගින් සාර්ථක පිළිතුරු අපේක්ෂා කළ හැකි ය. පුරාතන සාහිත්‍යයේ ගද්‍ය-පද්‍ය පාඩම්වල කථා සාරය, අවස්ථා හා සිද්ධි මතකයේ රැඳෙන ආකාරයට ඉගැන්වීම සඳහා විවිධ ඉගැන්වීම් ක්‍රම යොදා ගැනීමට ගුරුභවතුන් යොමු විය යුතු අතර එමගින් අපේක්ෂකයන්ගේ සාධන මට්ටම් වර්ධනය කරගැනීමට අවස්ථාව සලසා දීම ද වැදගත් වේ.

## 03 ප්‍රශ්නය

**3.** (i) උපහාසය හා අනුකම්පාව පෙරදැරිව කෙරෙන චරිත නිරූපණයත්

(ii) උචිත උපමා හා යෙදුම් භාවිතයත්

'උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුව' රසවත් වීමට ඉවහල් වී ඇත. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**අපේක්ෂිත පිළිතුර හා ලකුණු දීමේ පටිපාටිය**

03. (i) උපහාසය හා අනුකම්පාව පෙරදැරිව සිදු කෙරෙන චරිත නිරූපණය

* උග්ගසේන සිටු පුත්‍රයා තම පරම්පරාව, ධනය, දෙමාපියන් ආදීන් අමතක කොට විද්දත් දියණිය වෙනුවෙන් ජීවිතය කැප කිරීමට තීරණය කිරීම
 'ඈ කෙරෙහි බලවත් වූ ප්‍රේම ඇතිව ලදොත් ජීවත් වෙමි. නොලදොත් මියෙමි. සිතා ගෙන නොකා නොබී හැඳට නැගිලා.......'

* විද්දත් දූ උග්ගසේනට තම පුතු නළවන අවස්ථාවේ දී දොස් නැගීම
 'ගැල් රකිනවුගේ පුත, බර උසුලන්නවුගේ පුත කුමකුත් නො දත්තවුගේ පුතැ.....'

* උග්ගසේන ගැල් ගමන් නැවැත්වූ අවස්ථාවල ද තමාට තරම් නොවන දේ කිරීම
 'ගොන්ට තණ ගෙනවුත් ලති. කෙළි ලළු පෑ ඇවිද තැන ලත් දෙයක් යන එන තැනට අදිති'

* උග්ගසේන තම බිරිඳ නින්දා කරන්නේ කාටදැ'යි විමසන අවස්ථාවේ බිරිඳගේ ප්‍රකාශය.
 'එසේය අනෙක් කාට කියම් ද තොප ම කොට ඇවිදිනා කටයුතු හෙයින් තොප ම අරභයා කියමි.'

* උග්ගසේන තමාට තවදුරටත් නින්දා කරයි නම් ඈ අතහැර පලා යන බව කියන විට ඇය
 'තොප ගිය මැන, හුන මැනවː තොප කුමකුත් නොදන්නා තැනැත්තවුන්ගෙන් මට කම් කිම්දැ'?

* උග්ගසේන උගත් ශිල්පය සිය නගරවාසීන්ට පෙන්වන අවස්ථාවේ සියල්ලන් එදෙස නොබලා බුදුන් දෙස බලා සිටින අවස්ථාව.
 'බුදුන් අවුත් මෙතැනට සම්භව ඔබ ම අමුතුව පහළ වූවා සේ බලන බව මුත් මෙනුවරට මා ආදියෙන් පානා කෙළි බලන්නෝ නැත. පැසුණු ගොයම් මුල්වූවා සේ දුක් ගෙන........'
 ආදී නිදසුන් ඉදිරිපත් කොට විස්තර කළ යුතු ය.

(ii) **උචිත උපමා හා යෙදුම්**

පැසුණු ගොයම් මුල් වූවා සේ දුක් ගෙන...

* කර'ග රහත් වන්නා සේ
 අවකප්පනයෙන් සැදූ හසු රැන අල්වා ඇදි ඇදි සේ දුවන්නා සේම
 ම දුව විකුණන්නා නැත රන් හැරගෙන නො දෙමි
 අප හා එක්වන්නා ම දුව පාවා දෙමි.
 'එසේ වී නම් විද්දත් උන් හා එක්වෙමි. දුවගේ භාවභාව ලීලා දැක වායෝධාත්වාධික රූප කලාප විකාරයත් බලවත් නියායි.'
 ආදි උපමා හා යෙදුම් කතාව රසවත් වීමට යොදා ගෙන ඇති ආකාරය විස්තර කර තිබිය යුතු ය.

**උදාහරණ සඳහා ලකුණු 04 යි**
**සමස්ත විස්තරයට ලකුණු 11 යි**
**මුළු ලකුණු 15 යි**

**නැතහොත්**

(i) අවස්ථෝචිතව චරිත වෙනස් කිරීම

(ii) සරල භාෂා භාවිතය

ගුත්තිල කාව්‍යය රසවත් කාව්‍යයක් වීමට හේතු වී ඇත. නිර්දිෂ්ට කවිවලින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

**අපේක්ෂිත පිළිතුර හා ලකුණු දීමේ පටිපාටිය**

(i) අවස්ථෝචිතව විරිත් වෙනස් කිරීම.

1. සරල විරිතෙන්
   "ගුත්තිල ඇදුරු සඳ......"
   "දෙදෙනම ඉඳ දෙපිට......."

* රස ජනනය වන පරිදි අවස්ථෝචිතව විරිත් යොදා ගෙන ඇත.

* "කන්කලු වෙණ නද ඇසුමෙහි ලොබිනේ......"
   "අසන රිසින් නයි කැල ඔසලෝයා........"

* " දිය දිය ගොස පළ කෙරෙමින් සපැමිණි........."
   "මන් මත් කරවන දන මුළු දෙරණා........"

* "රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා........"
   "පුන් මදාරා මල් දමින් මුළු දිගු සුනිල් වරලස ගොතා........"

* මහ පියුම් විරිත
   පෙද විරිත
   විසිහයමත් විරිත ආදි විරිත් සඳහන් කරමින් ඊට අදාළව නිදසුන් දක්වා ඇතොත් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.
   මෙහි දී විරිත් නම් කොට නොතිබුණ ද යෝග්‍ය පරිදි විරිත් භාවිත කළ බව නිදසුන්වලින් තහවුරු කර ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.


(ii) සරල භාෂාව

උදා :- 1. ගුත්තිල ඇදුරු සඳ...........'
7. අප බෝසතුන් මිස .........'
13. දෙවැනි තුන් වැනි තත.......'
18. මන මත් කරවන දන මුළු දෙරණා......'

මේ සඳහා අදාළ කර ගත හැකි වෙනත් නිදසුන් ද (නියමිත කොටසින්) ලියා ඇති කල්හි සම්පූර්ණ ලකුණු දෙන්න.


**උදාහරණ සඳහා ලකුණු 04 යි**
**සමස්ත විස්තරයට ලකුණු 11 යි**
**මුළු ලකුණු 15 යි**

**3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා**




තුන්වන ප්‍රශ්නය ද අනිවාර්ය ප්‍රශ්නයකි. අපේක්ෂකයන්ගෙන් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇත්තේ 89%ක් පමණි. මෙම ප්‍රශ්නයට ලකුණු 15ක් හිමිවෙයි.

ඉන් ලකුණු 00-03 ප්‍රාන්තරයේ 14%ක් ද
ලකුණු 04-07 ප්‍රාන්තරයේ 21%ක් ද
ලකුණු 08-11 ප්‍රාන්තරයේ 33%ක් ද
ලකුණු 12-15 ප්‍රාන්තරයේ 32%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 07ට වඩා ලබා ගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 65%කි. අපේක්ෂකයන්ගෙන් 14%ක් ලකුණු 04ට අඩුවෙන් ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් යුක්ත වන අතර ඉන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

පළමු වන ප්‍රශ්නයෙහි පහසුතාව 52%කි. නැතහොත් ප්‍රශ්නයෙහි පහසුතාව 59%කි. ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 55%කි.

මෙහි පළමු වන ප්‍රශ්නයේ පහසුතාවට වඩා නැතහොත් ප්‍රශ්නයේ පහසුතාව වැඩි වී ඇති බව පෙනේ. මෙයට හේතුව සද්ධර්ම රත්නාවලියේ උග්ගසේන කථා වස්තුව ඇසුරෙන් පිළිතුරු ලියනවාට වඩා ගුත්තිල කාව්‍යයේ වෙණ මිහිර පාඨම ඇසුරෙන් පිළිතුරු ලිවීම අපේක්ෂකයාට පහසුවීමයි.

උදාහරණ දැක්වීම සාර්ථක මට්ටමක පැවතිය ද ප්‍රශ්නයට ගැලපෙන ලෙස විස්තර කිරීම සිදු නොකිරීම අඩු ලකුණු ලැබීමට හේතු වී ඇත.

සමස්තයක් වශයෙන් ගත් කල මෙකී ප්‍රශ්නවලට උචිත පිළිතුරු පන්ති කාමරයේ දී සාකච්ඡා කිරීම, ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ කිරීමේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම තුළින් නිර්දිෂ්ට කෘති කෙරෙහි අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර වර්ධනය කර පිළිතුරු සැපයීමේ හැකියාව සතුටුදායක මට්ටමකට ළඟා කර ගත හැකි වනු ඇත.

04 ප්‍රශ්නය

**4.** (i) සිළිඳුගේ චරිතයත්

(ii) පුංචිමැණිකාගේ චරිතයත්

බැද්දේගම නවකතාව තුළ නිරූපණය කර ඇති ආකාරය නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් සාකච්ඡා කරන්න.

### අපේක්ෂිත පිළිතුර හා ලකුණු දීමේ පටිපාටිය

(i) සිළිඳුගේ චරිතය නිරූපණය කර ඇති ආකාරය :-

* සිළිඳුගේ අණට කීකරුව පුළුවන් උපක්‍රමයකින් ඔවුන් ආපසු එනතුරු කර්ලිනා හාමිත් සමග ගෙදර බලා සිටිනවා විනා පුංචි මැණිකා විසින් කළ හැකි අන් කිසිවක් නො වී ය.
- සිළිඳුගේ අණට දරුවන් කීකරු බව
- සිළිඳු දරුවන්ට ආදරය කළ බව මින් කියැ වේ.

* දරුවන්ට කතා කියා දීම
- පරිසරය හඳුන්වා දීම
- පරිසරයට ආදරය කරන බව

'කුඩා කල සිළිඳු කී වනයෙහි මංමුලා වූ දඩයක්කාරයින්ගේ කතා ඇට සිහි විය.' යන්න තුළින් මතු වේ.

*
- සිළිඳු දඩයක්කරුවෙකු බව
- කොටියෙකු මෙන් රළු නපුරු මිනිසෙකු බව
- 'පිස්සු වැද්දා කොටියෙකැයි කියන්නට පුරුදු වී සිටි ගම්මුන් පුංචි මැණිකා ගැන කීවේ කොටියාගේ පැටියා මුවෙක් වෙලා කියාය.' කියමනෙන් පැහැදිලි වේ.

*
- අදූරදර්ශී බව
- සමාජය ගැන ඇති අනවබෝධය පහත කියමනෙන් සනාථ වේ

'සිළිඳු කීවාක් මෙන් බබුන්ගේ පැමිණීමෙන් පසු සියලු ම කරදර ඉවර වී ඔක්කොම හොඳ වෙයි යන බලාපොරොත්තුව ඇතිව ය.'

(ii) පුංචි මැණිකාගේ චරිතය නිරූපණය කර ඇති ආකාරයඃ-
* අභියෝග (දුෂ්කරතාවලට) මුහුණ දීමේ හැකියාව
* ඉවසීම
* අධිෂ්ඨානශීලි බව
* නොපසුබස්නා උත්සාහය
* තම පියා හා ස්වාමියා කෙරෙහි දක්වන දැඩි ආදරය

**අභියෝග**
* පුංචි මැණිකාගේ හද දෙදරුම් කෑවේ ය. ඈ තමාගේ ලොකු ඇස් දෙක වෙදරාලගේ මුහුණට හෙළා ගමන් නො සැලී සිටියා ය.
* හිරපල්ලා තම කතාවෙන් බලාපොරොත්තු වූයේ හිස අත්බදාගෙන කෑ ගසන ගැහැනියකගේ විලාපයකි. එහෙත් පුංචි මැණිකා නිශ්ශබ්දව ම එතැනින් ගොස් නැවතත් බිත්තිය අද්දර ඇන තියා ගැනීම.
* එයා මැරිලා සීයේ......, මං යනවා.

**(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න.**
**එක් කොටසකට උදාහරණ දෙකක් දක්වා තිබීම ප්‍රමාණවත් ය.)**
**(උදාහරණ සඳහා ලකුණු 04 යි, සමස්ත විස්තරයට ලකුණු 11 යි, මුළු ලකුණු 15 යි)**

(i) අධිෂ්ඨානශීලීභාවය
- පුංචි මැණිකා නිශ්ශබ්දව ම වෙදරාලගේ ගෙයින් සෙමින් දොරට බැස ගෙදර ගියා ය. සිර ගෙදරට ගොස් ඔවුන් ගැන විමසන්නට ඈ සිතා ගත්තා ය.
- මට බොහොම මහන්සියි සීයේ මං බොහොම කරදර විඳගෙන ආවේ. එයා සොයන්න.
- ඒත් හිර ගෙදරින් අහන්ඩ ඕනෑ. ඉස්සර වෙලා මගේ මිනිහා ගැන.

**ස්වාමි භක්තිය/ පිය සෙනෙහස**
- බබුන් සිර ගෙට නියම වීමත්, ඇගේ පියා ඇට නැති වීමත්, පියාගේ ඉරණම පිළිබඳව ඇගේ සිතේ පැවති බියත් නිතර ඇගේ දුක හා දොම්නස ද දියුණු කළේ ය.
- පුංචි මැණිකා දවස පටන් ගන්නට පුරුදු වූයේ අද බබුන් ගෙදර එයි යන බලාපොරොත්තුවෙනි.
- මහල්ලාගේ කතාවෙන් උපන් සන්තාපයත් දුකත් එකතු විය. ඈ නිසොල්මනේ වැලපෙන්නට වූවා ය.
- 'කොහොම ද මම එයාගෙ නම කියන්නේ අයියා?'
- 'එයාට මොකද වුණේ? දවස් ගණනක් තිස්සේ මං මෙහාට ආවේ මේක දැන ගන්ඩ'......

**නැතහොත්**

**(i) අපූර්ව කාව්‍යෝක්ති භාවිතයත්**

**(ii) පරිසරයේ ස්වාභාවික සිද්ධි සජීවීව ඉදිරිපත් කිරීමත්**

**'වස්සානය' කවිපෙළ රසවත් නිර්මාණයක් බවට පත් වීමට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් සාකච්ඡා කරන්න.**

(ලකුණු 15 යි)

(i) අපූර්ව කාව්‍යෝක්ති භාවිතයඃ-

"ඔය දැල දොඩමලුය සුවඳ බැරුවා ඉන්ට"
"කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩාගෙන"
"කුඹුක් අතු වතුර අත ගගා නැමිලා දියට"
"හුලංදා ඔය කිමිද මල්වරව ඉල්මහට"
"සෙනේහය පිරී ගිය ඔබේ නයන නිල් පොකුණ"
"කටු පොකුර සිප ගනිමි හෙට මලක් වනු පිණිස"

ආදි නිදසුන් මගින් ලියා තිබිය යුතු ය.

**පරිසරයේ ස්වාභාවික සිද්ධි සජීවීව ඉදිරිපත් කිරීම:-**


"ඔය දැල දොඩමලුය සුවඳ බැරුවා ඉන්ට"
"කුඹුක් අතු වතුර අතගගා නැමිලා දියට"
"වැහි වලාකුළු රංචු කඳු මුදුන්වල ලගින
රමණීය වන ගැබෙහි මොනරුන්ට පිල් වියන
සන්නාලියන් කොහොම ඇන්දාද දේදුන්න
ගිම්හානයේ ගිලන් වී කෘශව සුදුමැලිව ඇදි ඇදී ඉකි ගැසූ ගඟ නැවත පිරිපුන්ය.

"කුඹුක් අතු වතුර අත ගගා නැමිලා දියට
"හුලංඇා ඔය කිම් ද .................

ආදී නිදසුන් මගින් පරිසරයේ ස්වාභාවික සිද්ධි සජීවීව ඉදිරිපත් කර ඇති බව තහවුරු වී ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

ඉහත සඳහන් අංශ දෙක සඳහා දී ඇති නිදසුන් හෝ වෙනත් නිදසුන් දක්වා පැහැදිලි කිරීම අවශ්‍ය වේ.
**(උදාහරණ සඳහා ලකුණු 04 යි, සමස්ත විස්තරයට ලකුණු 11 යි, මුළු ලකුණු 15 යි)**


**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා**




මෙම ප්‍රශ්නය ද අනිවාර්යය. පළමු ප්‍රශ්නය සකස් වී ඇත්තේ "බැද්දේගම" නවකථාවෙනි.

දෙවන ප්‍රශ්නය "වස්සානය" පද්‍ය පන්තිය ඇසුරෙන් සැකසී ඇත.

ලකුණු 15කින් සමන්විත මෙම ප්‍රශ්නය සඳහා
ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 19%ක් ද
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 20%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 28%ක් ද
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 33%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 07ට වඩා ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 61%කි. අපේක්ෂකයන්ගෙන් 39% ලබාගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




4 ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් යුක්ත වූ අතර ඉන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 48%කි. මෙහිදී "බැද්දේගම" නව කතාව ඇසුරෙන් විමසා ඇති ප්‍රශ්නයේ පහසුතාව 39% වන අතර, 'වස්සානය' පද්‍ය පන්තිය ඇසුරෙන් සකස් වූ නැතහොත් ප්‍රශ්නයේ පහසුතාව 59%කි.

උදාහරණ සැපයීමේ දී 'වස්සානය' පද්‍ය පන්තිය අපේක්ෂකයන්ට පහසු වීමත් 'බැද්දේගම' ඇසුරෙන් උදාහරණ සැපයීම අපහසු වීමත් දක්නට ලැබුණි.

බැද්දේගම නවකථාව ඇසුරෙන් පිළිතුරු සැපයීමේ දී උදාහරණ පාඨ උපුටා දැක්වීම හා අදාළ විස්තර කිරීම් කළ යුතු අතර බොහෝ අයැදුම්කරුවන් පාඨ ඉදිරිපත් කිරීමටත් අදාළ විස්තර ප්‍රශ්නයට ගැළපෙන පරිදි යොමු කිරීමටත් අපොහොසත් වී ඇති බව පෙනුණි.

නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් විමසිය හැකි ප්‍රශ්න පිළිබඳ ව අයැදුම්කරුවන් දැනුවත් කිරීමත් ප්‍රශ්නයකට අදාළ ව පිළිතුරු ගොනු කර ගැනීමට හුරු කිරීමත් අවශ්‍ය බැවින් පන්ති කාමරයේ දී ඒ පිළිබඳ අවධානය යොමු කිරීමට ගුරුභවතුන් කටයුතු කළ යුතු බව අවධාරණය කෙරේ.

5 ප්‍රශ්නය

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

**5.** සමාජයට අවැඩ සිදු කරන්නන් නිසා මිනිසුන්ගේ ජන ජීවිතය අඩාළ කරන ආකාරය 'අඟුල්මල් දමනය' ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න. (ලකුණු 10 යි)

**අපේක්ෂිත පිළිතුර හා ලකුණු දීමේ පටිපාටිය**

★ ජන ජීවිතය අඩාළ කරන ආකාරය

1. මිනිසුන් තමන් ජීවත් වූ ගම්බිම් අතහැර ආරක්ෂිත ස්ථාන කරා ගමන් කිරීම
   "එකල්හි ගම් වැස්සො ගම් පියා ගොස් නියම් ගම් වන්හ. නියම් ගම්වැස්සො ගොස් නුවර වන්හු. තුන් යොජනක් තන්හි මිනිස්හු ගෙ පියා දරුවන් අතැ ගෙනැ ගොස්......"
2. මිනිසුන්ට සිය දෛනික කටයුතු කරගැනීමට නොහැකි වීම
   "හෙ හැම අරණ්‍යයෙහි හසර නැති කෙළෙ. දර පලා සඳහා වල් යන්නාහු නැති......."
   "රෑ ගමට වැද පයින් පැහැර දොර ගලවා පියා එහි හොතුවන් මරාපියා........"

★ රාජ්‍ය පාලනයට බාධා

"මිනිස්සු ගෙපියා දරුවන් අතැ ගෙනැ ගොස් සැවැත් නුවර වටා කඳවුරු බැඳැ රාජාඞ්ගණයෙහි රැස් වැ......."

"මහරජ තොපගේ රට අඟුල්මල් නම් සොරෙකැ දරුණැ. ලෙමුඩු අත් ඇත්තේ යැ. ගම් නොගම් කෙළෙ. නියම් ගම් නොනියම්ගම් කෙළෙ......."

ආදී නිදසුන් මගින් පිළිතුර ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න.

(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න.)


**උදාහරණ සඳහා ලකුණු 03 යි**

**සමස්ත විස්තරයට ලකුණු 07 යි**

**මුළු ලකුණු 10 යි**

**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා**


**ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




මෙම ප්‍රශ්නය අඟුල් මල් දමනය පාඩම ඇසුරෙන් සැකසී ඇත. 5, 6, 7 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයක් පමණක් තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ය. මෙවර අයදුම්කරුවන්ගෙන් 31%ක් පමණ 5 ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබිණ. එහි සමස්ත පහසුතාව 46%කි.

ලකුණු 10ක් හිමිවන මෙම ප්‍රශ්නය සඳහා ලබා ඇති ලකුණු ගණනය කිරීමේ දී,
ඉන් ලකුණු 00-02 අතර ප්‍රාන්තරයේ 25%ක් ද
ලකුණු 03-05 අතර ප්‍රාන්තරයේ 28%ක් ද
ලකුණු 06-07 අතර ප්‍රාන්තරයේ 20%ක් ද
ලකුණු 08-10 අතර ප්‍රාන්තරයේ 27%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත.

ලකුණු 6ත් 10ත් අතර ලබා ගෙන ඇති ප්‍රතිශතය 47%කි. 53%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 06ට අඩුවෙනි.




5, 6, 7 යන ප්‍රශ්නවලින් අඩු ම පහසුතාවක් ලබාගෙන ඇත්තේ 5 වන ප්‍රශ්නයට ය. මෙයට හේතුව පුරාතන ගද්‍ය සාහිත්‍යයට අදාළ ප්‍රශ්නවලට වඩා නූතන සාහිත්‍ය කෘති ඇසුරෙන් සැකසුණු ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට අපේක්ෂකයා වැඩි නැඹුරුවක් දැක්වීම ය. මෙම තත්ත්වය මගහරවා ගැනීමට නිර්දිෂ්ට පුරාතන ගද්‍ය සාහිත්‍ය කෘති පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කිරීමත්, ඒ ඇසුරෙන් විමසිය හැකි ප්‍රශ්න කෙරෙහි අයැදුම්කරුවන්ගේ අවධානය යොමු කිරීමත්, නිරන්තර අභ්‍යාසවල යෙදවීමත් පුරාතන ගද්‍ය සාහිත්‍යය රසවත් ව ඉගැන්වීමෙන් ඒ පිළිබඳ ව රුචියක් ඇති කිරීමත් මගින් මෙවැනි ප්‍රශ්නවලට උපරිම ලකුණු ලබා ගැනීමට අවස්ථාව සැලසිය හැකි ය. ඒ පිළිබඳ ව ගුරුභවතුන්ගේ අවධානය යොමු විය යුතු බව අවධාරණය කෙරේ.

ප්‍රශ්න අංකය - 6

**6.** "පැරණි ගැමි සමාජයේ මිනිසුන්ගේ ආකල්ප හා සිතුම් පැතුම් වෙනස් කිරීමේ අභියෝගය 'අපට වැසිකිළියක්' කෙටි කතාවෙන් නිරූපණය වේ." උදාහරණ **තුනක්වත්** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10 යි)


අපේක්ෂිත පිළිතුර හා ලකුණු දීමේ පටිපාටිය

- ⋆ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා පැමිණ සුමාන දෙකක් ඇතුළත වැසිකිළියක් සෑදිය යුතු බව ප්‍රකාශ කරන අවස්ථාව
  "සුමාන දෙකක් ඇතුළත වැසිකිළියක් හදන්න ඕනෑ. මම ආයිමත් සුමාන දෙකකට පස්සේ එනවා. එතකොට වැසිකිළියක් හදල නොතිබුණොත් නඩු දානවා. එහෙම කළොත් උසාවි ගිහින් දඩ කන්න වේවි"
- ⋆ වැසිකිළියක් පාවිච්චි කිරීමට හේරත් තුළ වූ අකමැත්ත ප්‍රකාශ කිරීම.
  "නීතියෙන් බේරෙන්ඩ හැදුවයි කියමු ගෙයක් ඇතුළ ඉඳ ගෙනත් ඔය වැඩේ කළ හැකි ද? කාට පුළුවන් උණත් මට නම් බෑ"
- ⋆ හැම දෙනා ම වැසිකිළි හදන නිසා තමන් ද සාදන බව හේරත් ප්‍රකාශ කිරීම
  "හැම දෙනා ම ලෑලි දමන හින්දා දැම්ම මිසක වළක් ඕනැයි කියල මට නම් කල්පනාවක්වත් උණේ නෑ"
- ⋆ තාත්තා පෙර පරිදි ම කැලයට යෑම
  "තවත් කාලයක් තිස්සේ පෙර සිරිත අනුගමනය කළේ තාත්තා පමණි"
- ⋆ තාත්තා වත්ත පහළ දිය පාර වෙත යෑම
  "දැන් එය තාත්තාට වුව ද ප්‍රයෝජන ගැනීමට අසීරු නොවන ස්ථානයක් වී ඇත. එහෙයින් ඔහු එහි යන නමුත් පැරණි ඇබ්බැහිකම්වල නෂ්ටාවශේෂයක් හැටියට ඉන් අනතුරුව වත්ත පහළ දිය පාර වෙත යයි."


මෙයින් උදාහරණ තුනක් ඉදිරිපත් කර තිබේනම් සාර්ථක පිළිතුරක් සේ පිළිගන්න.

උදාහරණ සඳහා ලකුණු 03 යි
සමස්ත විස්තරයට ලකුණු 07 යි
මුළු ලකුණු 10 යි

6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා




මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 26%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 00-02 අතර ප්‍රාන්තරයේ 16%ක් ද
ලකුණු 03-05 අතර ප්‍රාන්තරයේ 28%ක් ද
ලකුණු 06-07 අතර ප්‍රාන්තරයේ 30%ක් ද
ලකුණු 08-10 අතර ප්‍රාන්තරයේ 26%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත.




"අපට වැසිකිළියක්" කෙටිකතාව ඇසුරෙන් සැකසුණු මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 57%කි. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අයැදුම්කරුවන්ගෙන් 44%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 06 ට අඩුවෙනි. ලකුණු 5ට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 56%කි.

මෙම ප්‍රශ්නයට අඩු ලකුණු ප්‍රමාණයක් ලැබීමට හේතු වී ඇත්තේ නිර්දිෂ්ට කෙටි කතාව පිළිබඳ ව අයදුම්කරුවන්ගේ අවධානය නිසි පරිදි යොමු වී නො තිබීමත්, නූතන ගද්‍ය සාහිත්‍යය අවබෝධ කර ගැනීමට අවශ්‍ය නිසි මග පෙන්වීමක් නොලැබීමත් ය.

07 ප්‍රශ්නය

**7.** ශ්‍රාවක සිත් තුළ සමෘද්ධිමත් රටක් සඳහා ශ්‍රමදායකත්වයේ වටිනාකම ජනිත කරවීමට 'දැතේ කරගැට සිඹ සනසන්නට' ගීතය සමත් වී ඇති ආකාරය උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

අපේක්ෂිත පිළිතුර හා ලකුණු දීමේ පටිපාටිය

- ⋆ සමෘද්ධිමත් රටක් සඳහා ශ්‍රමදායකත්වයේ වටිනාකම ජනිත කරවීමට

i. "දැතේ කරගැට සිඹ සනසන්නට
ළා ගොයමේ දලු පවන් සලයි
දහදිය මුතු ඇට මල් වරුසා වී
කරල් බරින් පීදී වැගිරෙයි"

මහන්සි වී වැඩ කරගන්නන්ට සොබාදහම පවා සතුට, සැනසීම ලබා දෙන බව කවියා අපූර්වත්වයෙන් කියාපායි.

ii. “දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල
යළි ඉපදී ඇති මවු දෙරණේ
සත් රුවනින් නව නිදහන් මතු වී
පුතුගෙ සිනාවෙනි ඔප වැටුණේ”

අතීතයේ අපේ මුතුන් මිත්තෝ මහන්සි වී තම බාල පරම්පරාව වෙත බොහෝ දේ දායාද කළහ. වර්තමානය ගොඩ නැගී ඇත්තේ ඒ අතීත යෝධ මිනිසුන්ගේ ශ්‍රම දායකත්වයෙනි.

iii. “මා ගත වෙහෙසට ආදරයෙන් දිය
උල්පත පාදන පුංචි පුතුන්
ඒ ගත වෙහෙස ම සතුටක් වෙයි මට
ඔබ සිහිවන විට පුංචි පුතුන්”


මහන්සි වී වැඩ කිරීමෙන් රටේ ඇතිවන සංවර්ධනය බාල පරපුර වෙත දායාද කිරීම සතුටකි.

මේ නිදසුන් මගින් රටේ සමෘද්ධිය සඳහා ශ්‍රම දායකත්වයේ වටිනාකම කාව්‍යෝපක්‍රම භාවිත කරමින් ඉදිරිපත් කර ඇති ආකාරය විස්තර කර තිබිය යුතු ය.

(නිදසුන් 3 ක් ඉදිරිපත් කරමින් කරුණු දැක්වීම ප්‍රමාණවත් ය.
ගැළපෙන වෙනත් නිදසුන් ද පිළිගන්න.)


**උදාහරණ සඳහා ලකුණු 03 යි**
**සමස්ත විස්තරයට ලකුණු 07 යි**
**මුළු ලකුණු 10 යි**

**7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා**




“දෑතේ කරගැට සිඹ සනසන්නට” පද්‍ය පන්තිය පාදක කර ගෙන සැකසුණු මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව 31%කි. මෙහි සමස්ත පහසුතාව 71%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 5%ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 10%ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 28%ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 57%ක් ද
ලබා ගෙන ඇත.





"ඇතේ කරගැට සිඹසනසන්නට" පද්‍ය පන්තිය ඇසුරෙන් පිළිතුරු සපයා ඇති අයදුම්කරුවන්ගෙන් 15%ක් ලකුණු 06 ට වඩා අඩුවෙන් ලබා ගෙන ඇත. 0ත් 2ත් අතර ලකුණු ලබා ගෙන ඇති පිරිස 5%කි. ලකුණු 6-10 ලබා ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 85%කි. ඒ අනුව පැහැදිලි වන්නේ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් සපයා ඇති පිළිතුරු ප්‍රශස්ත මට්ටමක තිබූ බවයි.

මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිශතය 31%ක් වුවත් එහි පහසුතාව 71%ක් වීමෙන් පැහැදිලි වන්නේ මෙම ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයන් මධ්‍යස්ථ මට්ටමක ලකුණු ලබා ගෙන ඇති බවයි.

* පිළිතුරු සැපයීමේ දී III වන ප්‍රශ්න පත්‍රය පිළිබඳ ව පොදුවේ බලන කල වැඩි ම පහසුතාව ලබා ගත් ප්‍රශ්න ලෙස පිළිවෙළින් 1, 7 දැක්විය හැකි ය. එවායේ පහසුතාව පිළිවෙළින් 62% සහ 71%කි.

2, 4, 5 ප්‍රශ්න පිළිවෙළින් 49%, 48% සහ 46% පහසුතා පෙන්නුම් කරන අතර, 3, 6 ප්‍රශ්න සඳහා 55% සහ 57%ක පහසුතාව පෙන්නුම් කරයි. මේ අනුව අඩු ම පහසුතාවක් දක්වන්නේ 5 වන ප්‍රශ්නයටය. එහි පහසුතාව 46%කි. ඒ අනුව III වන ප්‍රශ්න පත්‍රයේ සමස්ත පහසුතාව 55%කි.

සිංහල භාෂාව හා සාහිත්‍යය ප්‍රශ්න පත්‍රය දෙස සමස්තයක් වශයෙන් බලන කල්හි ප්‍රශ්න පත්‍ර තුනෙහි සමස්ත පහසුතාව පහත පරිදි වේ.
I ප්‍රශ්න පත්‍රයෙන් සමස්ත පහසුතාව 62%කි.
II ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව 65%කි.
III ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව 55%කි.



# III කොටස

## 3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

### 3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

**පොදු උපදෙස්**

* ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතු ය. එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්යය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද, යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතු ය.

* I වන පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩාත් නිවැරදි **එක්** පිළිතුරක් පමණක් තෝරා ගත යුතු ය. තව ද එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතු ය. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයා තිබේ දැයි සුපරීක්ෂාකාරී විය යුතු ය.

* II පත්‍රයේ හා III පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතු ය.

* අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවක ම අදාළ ස්ථානයේ ලිවිය යුතු ය.

* නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නො කිරීම මෙන් ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නො කළ යුතු ය. අදාළ අවස්ථාවල දී සුදුසු නිදසුන් ඉදිරිපත් කළ යුතු ය.

* පිළිතුරු සමන්විත විය යුතු වචන සංඛ්‍යාව දී ඇති විට, එම වචන සංඛ්‍යාවට හැකි තරම් ආසන්න වචන සංඛ්‍යාවකින් යුතු වන සේ පිළිතුරු සංවිධානය කර ගත යුතු ය. එසේ නොවීම ලකුණු අඩුවෙන් ලැබීමට හේතු විය හැකි ය.

**විශේෂ උපදෙස් :**

* අත් අකුරු සහ අක්ෂර වින්‍යාසය පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

* ශිල්පීය දක්ෂතා (පද බෙදීම, විරාම ලක්ෂණ, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම යන අංශ) පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

### 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සංවර්ධනය සඳහා අදහස් හා යෝජනා

★ සිංහල අක්ෂර මාලාව පිළිබඳ ව පෙළපොත්වල ඇති පාඩම් දෘශ්‍යාධාර භාවිත කරමින් හා ගුරු මාර්ගෝපදේශ ග්‍රන්ථ පරිශීලනය කරමින් නිවැරදි ව ලිවීමේ හැකියාව ප්‍රගුණ කළ යුතු ය.

★ උක්තාඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ ව 10 වන ශ්‍රේණියේ පෙළපොතෙහි අදාළ පාඩම් දෙකෙහි අභ්‍යාසවල යොදවමින් 10, 11 ශ්‍රේණි දෙකේ දී ම ක්‍රියාකාරකම්වල නිරත කළ යුතු ය.

★ පැරණි ගද්‍ය සාහිත්‍ය පාඩම් සිසුන් ලවා කියවීම හා කියවීමෙන් අවබෝධය ලබා ගැනීමට අවස්ථාව ලැබෙන පරිදි අභ්‍යාස සැලසුම් කළ යුතු ය.

★ රචනා ලිවීමේ දී ව්‍යූහගත රචනාවක් යනු කුමක් දැයි පැහැදිලි කර, අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී එවන් රචනාවකට ලකුණු ලැබෙන පිළිවෙළ හා ලකුණු ලබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳව 10 වන ශ්‍රේණියේ දී ම මග පෙන්වීම කළ යුතු ය.

★ ප්‍රායෝගික ලේඛන ලිවීමේ දී ඒ ඒ ලේඛනවල වෙනස හඳුන්වා දී ආකෘතියේ වෙනස්කම් සිසුන්ට පැහැදිලි කර දිය යුතු ය.

- සාහිත්‍ය පෙළපොතෙහි ඇතුළත් පාඩම් රසාස්වාදය සඳහා ඉඩ ප්‍රස්තා ලැබෙන පරිදි හැකි සෑම විට ම නාට්‍යානුසාරයෙන් ඉගැන්වීමට සුදුසු ඉගෙනුම්-ඉගැන්වීම් අවස්ථා සංවිධානය කරගත යුතු ය.

- ව්‍යාකරණ ඉගැන්වීමේ දී, කවිය, ගීතය හා ප්‍රායෝගික ජීවිතය ඇසුරෙන් නිදර්ශන සපයමින් රසවත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම ගුරුවරුන් විසින් නිර්මාණය කරගත යුතු ය.

- කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය පිළිබඳ සිසුන්ගේ අවබෝධය සතුටුදායක නොවන බැවින් සරු ඉගැන්වීම් ක්‍රම මගින් එහි භාවිත හැකියාව ඉහළ නැංවීමට පියවර ගත යුතු ය.

- සමානාර්ථ, විරුද්ධාර්ථ හා බහුඅර්ථ පද ඇතුළු වාක්කෝෂය සංවර්ධනය සඳහා උපකාර වන සරල අභ්‍යාසවල නිතර යෙදීමට අවස්ථා සම්පාදනය කළ යුතු ය.

- අක්ෂර වින්‍යාසය බොහෝ විට වැරදි ලෙස භාවිත කෙරෙන වචන තෝරා ගෙන ඒවා නිවැරදි ව භාවිත කිරීම සඳහා සතතාභ්‍යාස කළ යුතු ය.

- බාහිර පොත් පත් කියවීමට පෙලඹෙන පරිදි විෂය සමගාමී කටයුතු සංවිධානය කළ යුතු ය.

- පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට අමතර ව සිසුන් නිර්මාණකරණයෙහි යෙදවීමට ද උනන්දු විය යුතු ය.

- ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී අඩු සාධන මට්ටමක් සහිත සිසුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

- අත් පත්‍රිකා, රාජකාරි ලිපි ඇතුළු ලේඛන කුසලතා ප්‍රවර්ධනය සඳහා ප්‍රායෝගික ලේඛන අත්දැකීම් සිසුනට ලබාදීමට ක්‍රියා කළ යුතු ය.

- වාර විභාග ලකුණු පදනම් කර ගනිමින් සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයය සමත් වීමේ ලකුණු සීමාවට ආසන්න නො වූ සිසුන් සඳහා කෙටි කාලීන ප්‍රතිකාරක වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

- සංවේදී භාවයෙන් හා රසඥතාවෙන් පිරිපුන් රසිකයකු බිහි කිරීමෙහි ලා සාහිත්‍යයෙන් සිදුවනුයේ අපමණ මෙහෙයකි. එවන් පුද්ගලයින් සමාජයට මහඟු සම්පතකි. සමාජය මිනිස්කමින් පුරවන්නට නම් සාහිත්‍යය කෙරෙහි වඩාත් හොඳින් සිසුන් යොමු කරවීම කාලීන අවශ්‍යතාවකි. මේ පිළිබඳ ගුරු භවතුන් ඇතුළු අදාළ බලධාරීන්ගේ අවධානය යොමු විය යුතු ය.